(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 8(1).]

# පාර්ලිමේන්තුවේ අංක 8 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 අප්‍රේල් මස 10 වැනි බදාදා**

## 2013 අප්‍රේල් මස 23 වැනි අඟහරුවාදා
## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 1),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව, 2011 ජනවාරි 14 දිනැති අංක 1688/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 2),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව, 2011 නොවැම්බර් 25 දිනැති අංක 1733/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ආහාර පනත යටතේ නියෝග (අංක 3),— 1980 අංක 26 දරන ආහාර පනතේ 32 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ආහාර උපදේශක කමිටුව විමසා සාදන ලදුව, 2012 ජනවාරි 26 දිනැති අංක 1742/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 පෙබරවාරි 08 දිනැති අංක 1796/22 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ගොවිජන සංවර්ධන පනත යටතේ නියෝග,— 2011 අංක 46 දරන පනත මගින් සංශෝධිත, 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 1ආ වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 95 වැනි වගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මාර්තු 15 දිනැති අංක 1801/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.04.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 මැයි මස 07 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1531/'11

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලය තුළ, එක් එක් වර්ෂයේදී,

(i) රැකියා සඳහා විදේශ රටවලට ගිය තැනැත්තන් විසින් විදේශ රැකියා නියුක්ති කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) රැකියා සඳහා විදේශ රටවලට ගිය තැනැත්තන්ට රක්ෂණ ආවරණය ලබාදීම මගින් රජය විසින් උපයා ගත් ආදායම කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රැකියා සඳහා විදේශ රටවලට යන සේවකයින් හට රක්ෂණ ඔප්පු ලබාදීමට සුදුසුකම් ලබා ඇති රක්ෂණ සමාගම් කවරේද;

(ii) එම සමාගම් තෝරා ගනු ලබන්නේ නිසි ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය කිරීම මගින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2149/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පැමිණීමේ හා ප්‍රවාහන දීමනා වශයෙන් වර්ෂ 2005 සිට මේ දක්වා ආයතන සේවකයින් වෙත ගෙවා ඇති මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගෙවීම් සඳහා භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලේඛන සභාගත කරන්නේද;

(iv) භාණ්ඩාගාරයේ අනුමතිය ලබා ගෙන නොමැති නම්, එයට හේතු කවරේද;

(v) එම ගෙවීම සඳහා අනුමතිය ලබා දුන් පුද්ගලයා හෝ පුද්ගලයින් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2224/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන්ම නිවාස 15000කින් සමන්විත නව නිවාස යෝජනා ක්‍රම තුනක් ආරම්භකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති ආරම්භකළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන්කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් ව්‍යාපෘතිවල පදිංචිකර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2440/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන නිල්වලා යෝජනා ක්‍රමයට අයත් මුළු අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එම අමුණුවලින් දැනට විනාශයට පත් වී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විනාශයට පත් වී ඇති ඉහත සඳහන් අමුණු ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා ගොවීන් ගැටලු රැසකට මුහුණපා ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒවා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන්කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2524/'12

ගරු අනුර දිසානායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2011 වර්ෂය තුළදී පළමු වසරට පාසල් සිසුන් ඇතුළත් කරගැනීම, පෙළපොත් බෙදාදීම, නිල ඇඳුම් බෙදාදීම, 5 වසර ශිෂ්‍යත්වය සමත් වූ දරුවන්ට සහතික බෙදාදීම හා සපිරි පාසල් ව්‍යාපෘතිය ආරම්භ කිරීම යන කටයුතුවලට අදාළ එක් එක් ජාතික උත්සවය,

(i) පැවැත්වූ දිනය කවරේද;

(ii) පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) පැවැත්වීමට වැය කළ මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් සියලු ජාතික උත්සව පැවැත්වීමට වැය කළ මුළු මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2549/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පැලියගොඩ මාළු වෙළඳපොළ තුළ කප්පම් ගැනීමේ සිදුවීම් පිළිබඳව ශ්‍රී ලංකා පොලිසිය වෙත පැමිණිලි ලැබී තිබේද;

(ii) එම පැමිණිලි පිළිබඳව කරන ලද පරීක්ෂණ අනුව මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එම පැමිණිලිවලට අදාළව අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ අත්අඩංගුවට ගත් අයගේ නාමලේඛනයක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/'12

ගරු මනූෂ නානායක්කාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2012 වර්ෂයේ දී ගාල්ල අධ්‍යාපන කලාපයේ පිහිටි ජාතික පාසල්වල,

(i) පළමුවැනි ශ්‍රේණියේ සිට දහතුන්වැනි ශ්‍රේණිය දක්වා පන්තිවල ඉගෙනුම ලැබූ සිසුන් සංඛ්‍යාව එක් එක් පන්තිය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළමුවැනි ශ්‍රේණියට සම්මුඛ පරීක්ෂණයෙන් සමත් සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කොට තිබේද;

(iii) පළමුවැනි ශ්‍රේණියට එසේ ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

(iv) පළමුවැනි ශ්‍රේණියට හැර අනෙකුත් ශ්‍රේණි සඳහා සිසුන් ඇතුළත් කර තිබේද;

(v) අනෙකුත් ශ්‍රේණි සඳහා ඇතුළත් කර ඇති එම සිසුන් කවුරුන්ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල් සඳහා සම්මුඛ පරීක්ෂණයන්ගෙන් සමත් වන සිසුන් හැර වෙනත් සිසුන් ඇතුළත් කිරීම සඳහා බලය පැවරූ නීත්‍යානුකූල ලිපි ලේඛන තිබේද;

(ii) එකී ලිපි ලේඛන මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2986/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති සඳහා ජල මූලාශ්‍ර යොදා ගැනීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා පමණක් යොදා ගැනීමට නියමිත ජල මූලාශ්‍ර වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීම යන හේතුන් නිසාවෙන් මධ්‍යම කඳුකරයේ ගොවිබිම් අක්කර 30,000ක පමණ ප්‍රමාණයක් ජලය නොමැතිවීම නිසා පුරන්වීමේ අවදානමකට ලක්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම කඳුකරය තුළ ස්වභාවික ජල මූලාශ්‍ර උපයෝගී කොටගෙන අස්වද්දනු ලබන වගා බිම් ප්‍රමාණය කොපමණද;

(ii) මධ්‍යම කඳුකරය තුළ ඇති ප්‍රයෝජනයට ගත හැකි ජල මූලාශ්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) අදාළ ජල මූලාශ්‍ර නිරවුල් කොට එම වගා බිම් අස්වැද්දීම සඳහා ඉඩ ලබාදී, ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා වෙනත් උපක්‍රමයක් භාවිතා කිරීමට කටයුතු සලසා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2936/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 1996-2006 දක්වා කාලය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදුවූ රු. 245,783,998.72ක වංචාවක් හෙළිදරව් නොකිරීම සම්බන්ධව රජයේ විගණනය භාර අධීක්ෂණ නිලධාරීන්ගේ වගකීම් පිළිබඳව පරීක්ෂා කිරීමට විගණකාධිපතිගේ අංක: S-1/12/14(xiii) හා 2008 ජනවාරි මස නියෝගයෙන් සිදුකළ පරීක්ෂණයේ වාර්තාව විගණකාධිපති වෙත ලබාදුන් දිනය;

(ii) එම වාර්තාවේ නිර්දේශ;

(iii) එම කාල සීමාවේදී ඉහත ආයතනයේ විගණනය භාරව සිටි පරීක්ෂණ නිලධාරීන් හා වෘත්තිය අධීක්ෂණ නිලධාරීන්ගේ නම් සහ වර්තමානයේ ඔවුන් දරන තනතුරු;

(iv) ඉහත නිර්දේශ අනුව වගවීමට හා වරදට යටත් නිලධාරීන්ට එරෙහිව ගත් විනය හා නීති ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2994/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රාජ්‍ය සේවයේ මේ වනවිට පවතින මුළු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුරප්පාඩු සංඛ්‍යාව තනතුරු නාම අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෑතකදී සංවර්ධන සහකාර ලෙස බඳවාගත් දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර සිටින සමස්ත උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ බඳවාගත් උපාධිධාරීන් සංඛ්‍යාව පළාත් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3004/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) තැපැල් කාර්යයන් සඳහා වඩාත් ජනප්‍රිය කුමන වටිනාකමක මුද්දරද යන්න එම ජනප්‍රියත්වයේ අනුපිළිවෙළින් කවරේද;

(ii) රු. 5/= ක වටිනාකමින් යුත් මුද්දරයක සාමාන්‍ය ප්‍රමාණය සෙ.මී. 2 x සෙ.මී. 2.5ක් වේද;

(iii) නැව් තැරැව්කරුවන්ගේ ආයතනයේ (Institute of Ship Brokers) 25 වැනි සංවත්සරය සැමරීම වෙනුවෙන් මුද්‍රිත රු. 5/= ක වටිනාකමින් යුත් මුද්දරයේ දිග සහ පළල කොපමණද;

(iv) පේරාදෙණිය සංගිලි පාලම සහ මහකන්දරාවේ ඉපැරණි ගල් පාලම මුද්‍රිත රු. 10/=ක වටිනාකමින් යුත් මුද්දර දෙකේ දිග සහ පළල කොපමණද;

(v) ඉහත (iii) සහ (iv) හි සඳහන් කළ එක් එක් මුද්දරයේ, කඩදාසි, මුද්‍රණ, ප්‍රවාහන, ගබඩාකරණ සහ බෙදාහැරීම් යනාදී වියදම් ද ඇතුළත් සමස්ත පිරිවැය කොපමණද;

(vi) සෙ.මී. 2 x සෙ.මී. 2.5ක සාමාන්‍ය ප්‍රමාණයේ රු. 5/= මුද්දරයක වියදම සමඟ ඉහත (iii) සහ (iv) හි සඳහන් එකිනෙක මුද්දරයක වියදම සන්සන්දනාත්මකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3100/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) උතුරු මැද පළාතේ, එක් එක් දිස්ත්‍රික්කයේ,

(i) රජයේ පාසල් සංඛ්‍යාව;

(ii) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ වසා ඇති පාසල් සංඛ්‍යාව;

(iii) සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව;

(iv) පවතින සම්පූර්ණ ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(v) එක් එක් විෂය අනුව පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(vi) වැඩබලන විදුහල්පතිවරු සංඛ්‍යාව;

(vii) ශ්‍රේණිධාරී ගුරුවරු සංඛ්‍යාව;

(viii) ස්වේච්ඡා ගුරුවරු සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරුමැද පළාතේ, පොළොන්නරු හා අනුරාධපුර දිස්ත්‍රික්කවල සේවය කරන ස්වේච්ඡා ගුරුවරුන් සඳහා වැටුප් ගෙවන්නේද;

(ii) එසේ නම්, එම වැටුප කොපමණද;

(iii) ඉහත දිස්ත්‍රික්කවල රජයේ පාසල්වල ගුරුවරුන් ලෙස සිවිල් ආරක්ෂක නිලධාරීන් සේවය කරන්නේද;

(iv) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(v) ඔවුන්ට අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ හෝ වෙනත් ආයතනයක් යටතේ ගුරු පුහුණුවක් ලබා දී තිබේද;

(vi) ඔවුන් ඉදිරියේදී ගුරු සේවයට අනුයුක්ත කිරීමට අපේක්ෂිතද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3174/'12

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉරිදා දිනවල පස්වරු 1.00 දක්වා උපකාරක පන්ති නොපවත්වන ලෙස දැඩි නීති රීති පනවා තිබියදීත් එම කාල සීමාව තුළ දිවයිනේ නොයෙක් ස්ථානවල කුඩා හා මහා පරිමාණයේ උපකාරක පන්ති පැවැත්වීම හේතුවෙන් දහම් පාසල්වලට පැමිණෙන ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවෙමින් පවතින බවත්;

(ii) දහම් පාසල් දරුවන්ට නිකුත් කරනු ලබන පෙළපොත් අවශ්‍ය ප්‍රමාණයට, කලට වේලාවට නොලැබෙන බවත්;

(iii) දහම් පාසල් අවසාන වසර විභාග පැවැත්වීමේ දිනයන් වෙනස් කිරීම දහම් පාසල් දරුවන්ගේ අධ්‍යාපනයට බලපාන බවත්;

(iv) දහම් පාසල් ගුරුවරුන් සඳහා ලබා දෙන නිල ඇඳුම් දීමනාව කලට වේලාවට නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) දරුවන් තවදුරටත් දහම් පාසල් අධ්‍යාපනයට හුරු කරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) දහම් පාසල් පෙළපොත් නිසි පරිදි ලබාදීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා ඇති බාධක කවරේද;

(iv) ගුරුවරුන්ගේ නිල ඇඳුම් දීමනාව කලට වේලාවට ලබාදීමට සහ අවසන් වසර විභාග පැවැත්වෙන දිනයන් වෙනස් කර සිසුන් අපහසුතාවයට පත්වීම වැලැක්වීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2331/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මධ්‍යම රජයේ හා පළාත් සභා යටතේ පාලනය වන පාසල්වල බුද්ධ ධර්මය විෂය ඉගැන්වීම සඳහා අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බුද්ධ ධර්මය විෂය ඉගැන්වීමට බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අය ගුරු සේවයට බඳවා ගැනීමට අදාළව අංක අමප/10/2376/436/052 යටතේ 2010 ඔක්තෝබර් 28 දින කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(ii) දැනට බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත්ව ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ ගුරුභවතුන් බඳවා ගන්නා ක්‍රියාපටිපාටියට අනුකූලව බුද්ධ ධර්මය විෂය ඉගැන්වීම සඳහා බෞද්ධ ධර්මාචාර්ය විභාගය සමත් අය බඳවා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම බඳවා ගැනීම් කොපමණ කාලයක් තුළ සිදු කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2465/'12

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අයත් ක්‍රිකට් ක්‍රීඩාංගන සඳහා දරන ලද මුළු වියදම කොපමණද;

(ii) එම වියදම සඳහා මුදල් ප්‍රතිපාදන වෙන්කිරීම ප්‍රාග්ධන සහ පොළී සංරචක අනුව කොපමණද;

(iii) අ(i) හි සඳහන් ක්‍රිකට් ක්‍රීඩාංගනවලින් ලබාගත් ආදායම එක් එක් වර්ෂයට අදාළව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 මැයි මස 08 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1850/'11

ගරු රවී කරුණානායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ, එක් එක් වර්ෂයේදී, එක් එක් වරායට අදාළව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ විශාලතම පිරිවැය ඉහළයාම් 10 සිදුවූයේ කවර කාර්යයන් සඳහාද;

(ii) ඉහත (i) හි සඳහන් පිරිවැය තීරණය කිරීමේදී සියලුම සාධක එක්ව සැලසීම මගින් ඇතිවූ ඒකාබද්ධ සමස්ත බලපෑම කවරේද;

(iii) පිරිවැය වැඩිවීමට සමානුපාතිකව ආදායමේ වැඩිවීමක් සිදුවී තිබේද;

(iv) නොඑසේ නම්, එම මූල්‍ය හිඟය පියවාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 6ක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ එක් සේවකයෙකු වෙනුවෙන් වූ අයභාරය, පිරිවැය, ලාභය සහ අගය එකතු කිරීම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2338/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මගින් කොළඹට පමණක් සීමා වී ඇති විශේෂඥ රෝහල්, දෙක බැගින් සෑම පළාතකම ස්ථාපිත කිරීමට යෝජනා කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වන විට එම රෝහල් ස්ථාපිත කිරීමේ කටයුතු ආරම්භ කර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2444/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි කොටියාගල වැව වර්ෂ පනහකට අධික කාලයක් තුළ කිසිදු ප්‍රතිසංස්කරණයකට ලක් නොකිරීමෙන් ක්‍රමයෙන් ගොඩවීමේ අවදානමකට ලක්ව ඇති බවත්;

(ii) යල-මහ දෙකන්නයම සඳහා ඉඩම් අක්කර භාරසීයකට පමණ ජලය සැපයූ මෙම වැව යටතේ දැනට වගා කටයුතු කරන්නේ මහ කන්නයේ දී පමණක් බව ත්;

(iii) මෙම වැව ආශ්‍රිතව පවත්වාගෙන ගිය මිරිදිය ධීවර කර්මාන්තය ද මේ වන විට අඩපණ වී, ඒ මත යැපුනු අය ආර්ථික අපහසුතාවයන්ට පත්ව ඇති බවත්;

(iv) එම වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කළහොත් ප්‍රදේශයේ විශාල පිරිසකට සෙත සැලසෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කොටියාගල වැව කඩිනමින් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මේවන විට වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2532/'12

ගරු අනුර දිසානායක මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 - 2011 අධ්‍යයන වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ එක් එක් විශ්වවිද්‍යාලයේ විදේශීය සිසුන් ඇතුළත් කර ගැනීමේ ප්‍රතිශතය 5% දක්වා වැඩිකර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිශතය අනුව ඉහත අධ්‍යයන වර්ෂයේ එක් එක් පීඨය සඳහා විදේශීය සිසුන් වෙනුවෙන් වෙන්කරන ලද අවස්ථා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මේ වන විට එම එක් එක් පීඨයට ඇතුළත්වී ඇති විදේශීය සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඒ අනුව දැනට එම එක් එක් පීඨයේ විදේශීය සිසුන් සඳහා පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීමට අනුගමනය කරන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 – 2011 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වූ විදේශීය සිසුන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා මුදල් ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2625/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂය සඳහා නව පාසල් වාරය ආරම්භ වූ දිනය කවරේද;

(ii) 2012 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් ලබාදීම වෙනුවෙන් ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

(iii) 2011 වර්ෂය සඳහා පාසල් නිල ඇඳුම් ලබාදුන් දිනය කවරේද;

(iv) එම වර්ෂයේදී පාසල් නිල ඇඳුම් ලබාදීම සඳහා ඇස්තමේන්තු කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2697/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012.05.01හෝ ඊට ආසන්න දිනක විලච්චිය, සිවලාපිටිය ග්‍රාමයේ සිදු වූ නිධන් හෑරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් කවුරුන්ද;

(ii) එකී පුද්ගලයන්ට එරෙහිව ගත් නීතිමය පියවර කවරේද;

(iii) එම නිධන් හෑරීම වළක්වාලීමට කටයුතු කළ අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත නිධන් හෑරීම රජයේ අනුදැනුම ඇතිව සිදුකර තිබේද;

(ii) එම නිධන් හෑරීමට විශේෂ කාර්ය බලකායේ භටයින් යොදවා තිබුණේද;

(iii) එසේ නම්, ඒ සඳහා අනුමතිය ලබාදුන් පුද්ගලයින් කවුරුන්ද;

(iv) එම නිධන් හෑරීම සිදුකරනු ලැබුයේ විශේෂ කාර්ය බලකායේ භටයන් විසින් නම්, ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

(v) විශේෂ කාර්ය බලකා භටයින් ඉහත නිධන් හෑරීම සිදුවූ ස්ථානයට ගොස් ඇත්තේ එම නිධන් හෑරීම සම්බන්ධයෙන් සොයා බැලීමේ සෝදිසි මෙහෙයුමකට නම්, ඒ පිළිබඳව එම ප්‍රදේශය භාර පොලිසිය දැනුවත් කර තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3006/'12

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවේ අරමුණු වනුයේ රජයේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශනයේ දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපායට සාපේක්ෂව රජයේ මූල්‍ය කාර්යසාධනය ඇගයීමට මහජනතාවට අවස්ථාව ලබාදීම බවත්;

(ii) වියදම, ආදායම, මුදල් ප්‍රවාහ සහ ණය ගැනීම සම්බන්ධයෙන් අදාළ වර්ෂයේ පළමු මාස හතර සඳහා ඇස්තමේන්තුගත සහ තථ්‍ය මුදල් ප්‍රමාණ පිළිබඳ ප්‍රකාශනයක් එකී වාර්තාවේ අන්තර්ගත විය යුතු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) 2012 ජූනි 29 දිනැති 2012 සඳහා වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාවෙහි, 2012 පළමු මාස හතර සඳහා,

(i) ඇස්තමේන්තුගත සහ තථ්‍ය වියදම;

(ii) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම;

(iii) ඇස්තමේන්තුගත සහ තථ්‍ය මුදල් ප්‍රවාහය;

(iv) ඇස්තමේන්තුගත සහ තථ්‍ය ණය ගැනීම්;

ඇතුළත්ව තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3040/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දැදුරුඔය දෙපස කිලෝමීටර් 40ක් දුරට යෝධ කුඹුක් ගස් කපන ජාවාරමක් සිදුවන බවත්;

(ii) සීරන්ගොඩ ප්‍රදේශයේ ගම්වාසීන් විසින් 2012 ජූනි මස 01 වැනි දින කුරුණෑගල පොලිස් ස්ථානයේ දූෂණ මර්දන ඒකකයට කළ පැමිණිල්ලක් අනුව ඉහත සඳහන් දැව ජාවාරම සිදුකළ අය අත්අඩංගුවට ගෙන තිබුණු බවත්;

(iii) 2012 ජූනි මස 01 වැනි දින ප.ව. 3.00ට අත්අඩංගුවට ගත් එම ජාවාරම්කරුවන් එදිනම ප.ව. 6.30 - ප.ව. 7.00ත් අතර මුදා හළ බවත්;

(iv) එම වැටලීම සිදු කළ පොලිස් නිලධාරියාට සති දෙකකට පසු වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවක් ලබාදී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වාරියපොල - ඇල්ල ප්‍රදේශයේ සිට වැල්ලව, ගනේවත්ත ප්‍රදේශය දක්වා දැදුරු ඔය ආශ්‍රිතව මේ වන විට කපා ඇති කුඹුක් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම කුඹුක් ගස් විනාශය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් ජාවාරම්කරුවන් කවුරුන්ද;

(iii) අත්අඩංගුවට පත් එම ජාවාරම්කරුවන් ඉහත අ(iii) හි පරිදි නිදහස් කර යැවීමට උපදෙස් ලබාදුන් අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3103/'12

ගරු පී. හැරිසන් මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ ඇති;

(i) ජනතාව පදිංචි ඉඩම් කට්ටි සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත ඉඩම් අතරින් සින්නක්කර ඉඩම් කට්ටි, බදු ඉඩම් කට්ටි හා අනවසර ඉඩම් කට්ටි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් බදු ඉඩම්ලාභීන්ට සින්නක්කර ඔප්පු ලබා දීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) එම කටයුතු කඩිනම් කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුර නගරසභා බල ප්‍රදේශය තුළ සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීමක් සිදු කරන්නේද;

(ii) නොඑසේ නම්, ඔවුන්ගේ පදිංචිය එම ස්ථානවලම නීත්‍යානුකූල කරන්නේද;

(iii) එම අනවසර පදිංචිකරුවන්ගෙන් වරිපනම් හෝ වෙනත් බදු මුදලක් අය කරන්නේද;

(iv) විදුලිය හා වෙනත් පහසුකම් ලබාදීමේදී ඔවුන්ගේ අයිතිය සනාථ කිරීම සඳහා පරීක්ෂා කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3138/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට වරදකරුවන්ව බන්ධනාගාර ගතව සිටින තැනැත්තන්ට සහ මරණීය දණ්ඩනයට යටත්ව සිටින තැනැත්තන්ට සමාවදීමේදී අනුගමනය කරන ප්‍රතිපත්තිය සඳහන් ලිඛිත සංග්‍රහයක් තිබේද;

(ii) එසේ නම්, එම ලිඛිත සංග්‍රහය ඉදිරිපත් කරන්නේද;

(iii) ඉහත කාර්ය පටිපාටිය සාධාරණ සහ විනිවිදභාවයෙන් යුතු විය යුතු බව පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වරදකරුවන්වී බන්ධනාගාරගත වූ තැනැත්තන්ට සහ මරණීය දඬුවම නියමවූවන්ට සමාවදීමේදී අපරාධ වින්දිතයන්ගේ අයිතිවාසිකම් කෙරෙහි සැලකිල්ලක් දක්වා තිබේද;

(ii) එසේ නම්, එම අවස්ථා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3287/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැගෙනහිර පළාතේ, පොතුවිල් නගරයේ තැපැල් කාර්යාලයක් නොමැති නිසා එම ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

(ii) හිදායාපුරම්හි, පොතුවිල් මධ්‍ය මහා විද්‍යාල පාරේ ක්‍රියාත්මක වූ උප තැපැල් කාර්යාලය වසා දැමීම හේතුවෙන් ජනතාව දැඩි දුෂ්කරතාවයන්ට මුහුණ දෙන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) පොදු ජනතාව මුහුණ දෙන මෙම දුෂ්කරතාවයන් පිළිබඳව සලකා බලා පොතුවිල් නගරයේ උප තැපැල් කාර්යාලයක් පිහිටුවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2342/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මඟින් ළමාවියේ දී මන්ද පෝෂණයට හෝ ඌන පෝෂණයට ලක්වන දරුවන් එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා අවශ්‍ය සියලුම වර්ගවල කිරි, බෙහෙත්, විටමින් හා ආහාර ද්‍රව්‍ය ජන සභාව හරහා බෙදා හැරීමට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන ජන සභා කාර්යාල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2469/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ දක්වා පවත්වා ඇති "දැයට කිරුළ" ප්‍රදර්ශණ සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ප්‍රදර්ශණය පැවැත්වූ ස්ථානය කවරේද;

(iii) එම එක් එක් ප්‍රදර්ශණය සඳහා වැයකළ මුදල කවරේද;

(iv) අනාගතයේදී පැවැත්වීමට සැලසුම්කර ඇති දැයට කිරුළ ප්‍රදර්ශණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශණය පැවැත්වූ දිනය කවරේද;

(ii) එය පැවැත්වූ ස්ථානය සහ එකී ප්‍රදර්ශණ භූමිය සඳහා පවරාගත් ඉඩම් ප්‍රමාණය කවරේද;

(iii) එම ප්‍රදර්ශනය සඳහා වූ සමස්ත පිරිවැය සහ එක් එක් අමාත්‍යාංශය වෙනුවෙන් වැයකළ මුදල කොපමණද;

(iv) ඒ සඳහා ගනු ලැබූ ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැයකළ මුදල සමස්ත වියදමේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(v) එම භූමියේ දැනට ඉතිරිව ඇති ප්‍රාග්ධන භාණ්ඩ හෝ ගොඩනැගිලි කවරේද;

(vi) එම ප්‍රදර්ශනය සඳහා ගනු ලැබූ ඉහත සඳහන් ප්‍රාග්ධන භාණ්ඩ සඳහා වැයකළ වියදම සාධාරණීකරණය කළ හැකිවන්නේ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3204/'12

ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 - 2012 කාල සීමාව තුළ වාර්ෂිකව ශ්‍රී ලංකාවට ආනයනය කළ පලතුරු වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් පලතුරු වර්ගයේ කිලෝවක වත්මන් මිල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ආනයනික පලතුරු කල් තබා ගැනීම සඳහා අනුමත කරන ක්‍රමවේදයන් කවරේද;

(ii) එම ක්‍රමවේදයන් මිනිස් සිරුරට හිතකර වන්නේද;

(iii) ඉහත ක්‍රමවේදයන් සම්බන්ධයෙන් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් හෝ වෙනත් ආයතනයක් වෙතින් සහතිකයක් ලබාගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දේශීය පලතුරු කල් තබා ගැනීමට උපයෝගී කර ගන්නා ක්‍රමවේදයන් කවරේද;

(ii) දේශීය පලතුරු ඉක්මනින් ඉදවීමට භාවිතා කරන ක්‍රමවේදයන් කවරේද;

(iii) එම ක්‍රමවේදයන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ පාරිභෝගික අධිකාරියේ අවසරය ලබා දී තිබේද;

(iv) පලතුරු ඉදවීමට රසායනික ද්‍රව්‍ය භාවිත කිරීමෙන් මිනිස් ශරීරයට හානි නොවන බවට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පාරිභෝගික ජනතාවට සහතිකයක් ලබා දෙන්නේද;

(v) පාරිභෝගිකයන්ට පිරිසිදු හා ගුණාත්මක පලතුරු වර්ග ලබාදීම සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, මන්ද?

3326/'12

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දොඩම්ගස්ලන්ද මැතිවරණ කොට්ඨාසයේ, රිදීගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා ඇති ප්‍රධාන පාසලක් වන පානගමුව අන්නූර් මධ්‍ය මහා විද්‍යාලයයේ ක්‍රීඩා පිටියක් සඳහා දැඩි අවශ්‍යතාවයක් පවතින බවත්;

(ii) එම පාසලේ දරුවන්ගේ දෙමව්පියන් විසින් ක්‍රීඩා පිටියක් සැකසීම සඳහා අක්කර දෙකක ඉඩමක් මිලදී ගෙන පාසලට පරිත්‍යාග කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගොඩ කුඹුරක් වන ඉහත සඳහන් ඉඩම ක්‍රීඩා පිටියක් ලෙස සංවර්ධනය කර දීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 මැයි මස 09 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1898/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තඹලගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කඩවාන වැව් බැම්ම කොටි ත්‍රස්තවාදීන් විසින් පුපුරවා හැර වර්ෂ විසි හයක් පමණ ගතවී ඇතත්, මේ දක්වා එය පිළිසකර නොකිරීම නිසා ගොවීන්ට වගා කටයුතු ආරම්භ කිරීමට නොහැකිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම වැව ප්‍රතිසංස්කරණය කිරීමට ඇති බාධාවන් කවරේද;

(ii) එම ගැටලු ඉවත්කර කඩිනමින් වැව අලුත්වැඩියා කිරීමට කටයුතු කරන්නේද;

(iii) ඒ සඳහා මේ වනවිට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2069/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2009 වර්ෂයේ සිට මේ දක්වා කොළඹ කොටස් වෙළඳපලෙහි මුදල් ආයෝජනය කළ,

(i) විදේශ සමාගම්වල නම් සහ එක් එක් සමාගම විසින් ආයෝජනය කළ මුදල කොපමණද;

(ii) එම ආයෝජනයන්ගෙන් මේ වන විට තම ආයෝජන ඉවත් කර ගෙන ඇති සමාගම් කවරේද;

(iii) එම ආයෝජනයන් ඉවත් කර ගත් දින කවරේද;

(iv) එම ආයෝජන ඉවත් කර ගැනීමට හේතු දක්වා තිබේද;

(v) එසේ නම්, එම හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2189/'11

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1970 - 1977 කාලයේ පැවති රජය යටතේ යාපනය දිස්ත්‍රික්කයේ පේසාලේහි ඛනිජ තෙල් ඇති බව සොයා ගනු ලැබුවේද;

(ii) එසේ නම්, ඛනිජ තෙල් සොයා ගනු ලැබූ දිනය කවරේද;

(iii) සොයා ගත් ඛනිජ තෙල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ ඛනිජ තෙල් සොයා ගත් බව වර්තමාන ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබුවේද;

(ii) එසේ නම්, සොයා ගනු ලැබූ ඛනිජ තෙල් ප්‍රමාණය කොපමණද;

(iii) එම ප්‍රමාණය දේශීය වෙළඳපොළට විකුණනු ලබන දිනය කවරේද;

(iv) තෙල් සහ ගෑස් මිල අඩු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2214/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබාදීම සඳහා තට්ටු නිවාස ඉදිකරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මධ්‍යම පාන්තිකයන්ට පහසු මිලට ලබා දීම සඳහා තට්ටු නිවාස ඉදිකිරීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති එම තට්ටු නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම තට්ටු නිවාස ඉදිකර ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2546/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද හමුදාවට, ගුවන් හමුදාවට සහ නාවික හමුදාවට ආහාර සැපයීම සිදුකරනු ලබන පුද්ගලයන් හා ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පුද්ගලයන් හා ආයතන තෝරා ගැනීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද පුද්ගලයන් හා ආයතන කවරේද;

(iv) එම එක් එක් පුද්ගලයා හෝ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

(v) තෝරාගනු ලැබූ පුද්ගලයන් හා ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2972/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වැන්දඹු හා අනත්දරු දායක මුදල් ගෙවා ගැනීමට නොහැකි තරමටම මධ්‍යම පළාත් සභාව දරුණු මූල්‍ය අර්බුදයකට මුහුණ පා ඇති බවත්;

(ii) වැන්දඹු හා අනත්දරු දායක මුදල් එම පළාත් සභාවේ සේවකයින්ගේ වැටුපෙන් අඩු කරනු ලැබුවද, එම මුදල් සේවකයන්ගේ විශ්‍රාම වැටුප් ගිණුම්වලට බැර කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට මධ්‍යම පළාත් සභාව විසින් බැර කිරීමට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) මේ වනවිට සේවකයින්ගේ වැටුප්වලින් වැන්දඹු හා අනත්දරු දායක මුදල් ලෙස අඩු කරගෙන ඇති මුදල කොපමණද;

(iii) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවීමට තිබූ මුදල් එම ගිණුම්වලට බැර කිරීමට නොහැකිවීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මධ්‍යම පළාත් සභා සේවකයින්ගේ දායක මුදල් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගිණුම්වලට බැර කිරීමට කටයුතු කිරීමටත්;

(ii) මෙම පළාත් සභාවෙහි පවතින මූල්‍ය අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීමටත්;

කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3094/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 1996-2006 කාල පරිච්ඡේදය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සිදුවූ වංචාවක් වැලැක්වීමට කටයුතු නොකිරීමෙන් විගණන පරීක්ෂක ජයවර්ධන නැමැත්තා විසින් වංචනික ක්‍රියාවක් සිදුකර තිබේද යන්න පිළිබඳ විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙසට පොලිස් දෙපාර්තමේන්තුවේ කොළඹ වංචා විමර්ශණ ඒකකයට දන්වා තිබේද;

(ii) ඉහත සඳහන් විගණන පරීක්ෂකවරයා අල්ලස් ලබා ගෙන තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලෙස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම වෙත දන්වා තිබේද;

(iii) එම නිලධාරියාට රැකියාවක් සඳහා විදේශගතවීමට වැටුප් රහිත නිවාඩු අනුමත කර දී තිබේද;

(iv) විධිමත් කමිටුවක් මගින් පැවැත්වූ මූලික විමර්ශණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොකොට, ඉහත පරිදි ඔහුට නිවාඩු අනුමත කිරීම නීති විරෝධී බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3141/'12

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) බඩල්කුඹුර නගරයේ ප්‍රධාන මාර්ග දෙපස ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඉහලින් විදුලි සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන දෙකක් යා කරනු ලබන අධිවෝල්ටීයතාවයකින් යුත් (වෝල්ට් 66000) විදුලි රැහැන් පද්ධතියක් ස්ථාපිත කර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) නගරයක් මධ්‍යයේ ඉහත සඳහන් ආකාරයේ විදුලි රැහැන් ඇදීම සිදු නොකිරීම සාමාන්‍ය ප්‍රතිපත්තිය බවත්;

(ii) එසේ තිබියදී, නගර මධ්‍යයේ එම අධිවෝල්ටීයතාවයෙන් යුතු විදුලි රැහැන් ඇදීම නගරයේ සංවර්ධනයට මෙන්ම නගරවාසීන්ටද විශාල බාධාවක් බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, එම අධිවෝල්ටීයතාවයෙන් යුතු විදුලි රැහැන් පද්ධතිය ඇද ඇති මාර්ගය වෙනස් කිරීමට ක්‍රියා කරන්නේද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3166/'12

ගරු ඊ. සරවනපවන් මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 49/89 ප්‍රකාරව දේපළ වන්දි ගෙවීමට උතුරු නැගෙනහිර පළාත් සභා අමාත්‍යාංශය කටයුතු කළ අවස්ථාවේදී, එම අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත ලැබුණු ඉල්ලුම්පත් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉල්ලුම්පත් ඉදිරිපත් කළ සියලු දෙනාට වන්දි මුදල් ගෙවනු ලැබුවේද;

(iii) එසේ ගෙවා නොමැතිනම්, ගෙවීම් කළ ඉල්ලුම්කරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) වන්දි නොගෙවන ලද ඉල්ලුම්කරුවන්ට අදාළ වන්දි මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය අවස්ථාවේදී 49/89 චක්‍රලේඛය අනුව ඉල්ලීම් ඉදිරිපත් කළ පිරිසගෙන් මෙතෙක් වන්දි මුදල් නොලැබී පීඩාවට පත්වූ පිරිසක් සුභසාධන කඳවුරුවල සිට පැමිණ කිළිනොච්චිය හා මුලතිව් ප්‍රදේශවල නැවත පදිංචි වී ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් පිරිසට කඩිනමින් වන්දි මුදල් ලබා දී ඔවුන්ගේ ජීවිත යථා තත්ත්වයට පත්කිරීමට යම්කිසි පියවරක් ගන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3205/'12

ගරු පී. හැරිසන් මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පූර්ව ළමාවිය සංවර්ධන වැඩසටහන යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති සමස්ත පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පෙර පාසල් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සේවය කරන පෙර පාසල් පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(v) එම පාලිකාවන් රජයේ ස්ථිර සේවයට බඳවා ගැනීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත පෙර පාසල් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිලිවල තත්ත්වය කවරේද;

(ii) ස්ථිර ගොඩනැගිලි නොමැති පෙර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) විදුලිබල පහසුකම් ලබා දී ඇති පෙර පාසල් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) පෙර පාසල් සඳහා කිසියම් දීමනාවක් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එහි වටිනාකම කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) විදුලිය, වැසිකිළි සහ ගොඩනැගිලි පහසුකම් නොමැති පෙර පාසල්වලට එම පහසුකම් ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) උතුරු මැද පළාත් සභාව මගින් පෙර පාසල් සඳහා ලබාදෙන පහසුකම් කවරේද;

යන්නත් එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2449/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අකුරැස්ස සහ අතුරලිය ප්‍රාදේශීය සභා මගින් එකතු කරනු ලබන කැලි කසළ ගොඩපිටිය, පානදුගම, කණහලාගම, ගවුස්වත්ත සහ ගොළුවත්තහේන යන ගම්මාන මධ්‍යයේ පිහිටා ඇති රෂිනාවත්ත නම් ස්ථානයට ගෙනවිත් දමනු ලබන බවත්;

(ii) එම ස්ථානයේ කුණු කසළ රැස්කිරීම නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි සෞඛ්‍ය තර්ජනයකට මුහුණපා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෂිනාවත්ත නමැති ස්ථානයට කැලි කසල ගෙනැවිත් දැමීම නවතා දැමීමට කටයුතු කරන්නේද;

(ii) මේ වන විට කැලි කසළ දැමීම සඳහා විකල්ප ස්ථානයක් තෝරාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2510/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 මාර්තු මාසය තුළ ජිනීවාහි පැවැත්වූ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයට සහභාගී වූ ශ්‍රී ලංකා දූත පිරිසට අයත් වූ සංඛ්‍යාව කොපමණද;

(ii) එම සැසිවාරයට සහභාගී වූ අයගේ නම් සහ තනතුරු කවරේද;

(iii) එම දූත පිරිස සඳහා වැයවූ මුළු මුදල කොපමණද;

(iv) මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාවට එරෙහිව ඉදිරිපත් වූ යෝජනාව පරාජය කිරීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග සහ ක්‍රමෝපායන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2713/'12

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 මාර්තු මස ජිනීවාහි පැවති මානව හිමිකම් කවුන්සිලයට ශ්‍රී ලංකාවට එරෙහි යෝජනාවක් ගෙන ඒමට පෙර, ඇමරිකා එක්සත් ජනපද රාජ්‍ය ලේකම්වරයා සමග නිල වශයෙන් පළමු හමුවීම පැවැත්වුණු දිනය කවරේද;

(ii) එකී හමුවීමෙහි දී සාකච්ඡාවට ලක්වූ කරුණු කවරේද;

(iii) ඉහත හමුවීමෙන් අනතුරුව, ඇමරිකානු එක්සත් ජනපදය විසින්ද ඉහත දැක්වූ ආකාරයේ යෝජනාවක් ගෙන එන්නට ඉඩ තිබෙන බව අපේක්ෂා කරනු ලැබුවේද;

(iv) ශ්‍රී ලාංකීය දෘෂ්ටිකෝණයෙන් ගත් කල ඉහත කී යෝජනාව පරාජයවීමට නොසැළකිලිමත්භාවය, උද්දච්චභාවය සහ අදක්ෂතාව හේතු වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ජිනීවාහිදී සම්මතවූ යෝජනාව සම්බන්ධයෙන් අද වනවිට ප්‍රතිකර්ම වශයෙන් ගෙන ඇති පියවර කවරේද;

(ii) පැවති ස්ථාවරයට පටහැනිව යමින් 2012 මැයි මස 18 වැනි දිනදී අමෙරිකානු එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් මහත්මිය හමුවීමට රජය කැමැත්ත පළ කළේ මන්ද;

(iii) එහිදී සාකච්ඡා කළ කරුණු සහ එකී හමුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස දැන් ක්‍රියාත්මක වන කටයුතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2772/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ අවුරුදු 18 - 22 අතර වයසේ පසුවූ තරුණ පිරිස ආසන්න වශයෙන් කොපමණ වූයේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම 2010"හි ඇතුළත් "වයස අවුරුදු 18 සිට 22 දක්වා සෑම දරුවෙකුටම අභිමතාර්ථය අනුව අවශ්‍ය තෘතියික අධ්‍යාපනයක් හෝ පුහුණුවක් ලබාගැනීමට රුපියල් ලක්ෂ 2ක් දක්වා මුදලක් වෙන්කර දෙන්නෙමි" යන පොරොන්දුව ප්‍රකාරව මේ වනවිට එකී මුදල ලබා දී ඇති තරුණයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වාර්ෂිකව වෙන්කරන ලද මුදල කොපමණද;

(iii) එම මුදල් ලබාදෙන ක්‍රමවේදය කවරේද;

(iv) වර්ෂයක් තුළ ඉහත සඳහන් පරිදි පුහුණුවක් ලබාදීමට ඉල්ලක්කගත තරුණයින් සංඛ්‍යාවක් සිටීද;

(v) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(vi) ඉහත වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ දින සිට මේ දක්වා ඊට තෝරාගත් තරුණයින් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3207/'12

ගරු පී. හැරිසන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2012 දක්වා කාල සීමාව තුළ දුම්රිය දෙපාර්තමේන්තුව ලබා ඇති පාඩුව පියවා ගැනීමට සකසා තිබෙන වැඩ පිළිවෙළ කවරේද;

(ii) දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම පාඩු ලැබීමට හේතුවී ඇත්තේ දුර ගමන් සේවා ක්‍රියාත්මක කිරීමෙන්ද; නැතහොත්, කෙටි ගමන් සේවාවලින්ද;

(iii) 2005-2012 කාල සීමාව තුළදී භාණ්ඩ ප්‍රවාහනය සඳහා දුම්රිය යොදා ගැනීම වැඩිවීමක් හෝ අඩුවීමක් සිදුවී තිබේද;

(iv) එසේ අඩුවීමක් තිබේ නම්, එයට හේතු කවරේද;

(v) ඉන්ධන ප්‍රවාහනය සඳහා දුම්රිය යොදා ගැනීම ලාභදායී ක්‍රමයක් වුවත්, ඒ සඳහා එම ක්‍රමය පුළුල්ව යොදා නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 මැයි මස 10 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1899/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයට අයත්ව තිබූ, ඉඹුල්පිටිය, ගා/ රාමදොල කණිෂ්ඨ විද්‍යාලයය මීට වර්ෂ කිහිපයකට පෙර වැසීයාම නිසා ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සම්පත් විනාශවෙමින් පවතින බවත්;

(ii) මේ වනවිට එම පාසල් භූමිය අසල්වාසීන් විසින් අත්පත්කර ගැනීමේ අවදානමක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බලහත්කාරයෙන් පාසල් භූමිය අත්පත් කරගැනීම නවතාලීමට කටයුතු කරන්නේද;

(ii) ගා/ රාමදොල කණිෂ්ඨ විද්‍යාලයය සතු භූමිය සහ ගොඩනැගිලි වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම කුමක්ද;

(iv) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2121/'11

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වර්ෂ 2005 සිට 2011 දක්වා කාල සීමාවේදී මාර්ග සංවර්ධන අධිකාරියට කුලී පදනම මත වාහන ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ලබා ගත් වාහන කවරේද;

(iii) එම වාහන කවර කාර්යයන් සඳහා යොදා ගන්නේද;

(iv) එම කුලී වාහන සැපයූ ආයතනවල නම්, ලිපිනයන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) ඉහත වාහන ලබාගත් වර්ෂයන් කවරේද;

(vi) මේ වන විට එම වාහන නිදහස් කර තිබේ නම්, එම නිදහස් කළ වර්ෂයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2187/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මෙරට අක්‍රියව පවතින රාජ්‍ය ව්‍යවසායන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යවසායන්හි නම් කවරේද;

(iii) එකී ආයතනයන්හි දැනට සේවයේ නියුතු සමස්ත සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ආයතන මේ වන විට ලබා ඇති සමස්ත අලාභය කොපමණද;

(v) එකී ආයතනයන්හි පවතින ගැටලු විසඳීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අක්‍රියව පවතින රාජ්‍ය ව්‍යවසායයන් පෞද්ගලීකරණය කිරීමට හෝ වසාදැමීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, මේ අවස්ථාවේදී එම ආයතන සඳහා යළි ප්‍රාග්ධනය සැපයීමක් සිදු කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2215/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාවේ ජනසෙවන වැඩසටහන යටතේ, සෑම ගමකටම වර්ෂයකට නිවාස 25 බැගින් ඉදිකිරීමට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි මේ වනවිට ඉදිකිරීම් අවසන් කර, ප්‍රතිලාභීන් පදිංචි කර ඇති සමස්ත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස පිහිටි ගම්වල නම් කවරේද;

(iii) එක් නිවසක් ඉදිකිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2537/'12

ගරු අනුර දිසානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ විකාශය කිරීමේ අයිතිය රාජ්‍ය රූපවාහිනී නාලිකාවලට අමතරව පෞද්ගලික නාලිකාවලට ලබාදීමේ පදනම කවරේද;

(ii) පසුගියදා පැවති කොමන්වෙල්ත් බැන්ක් (Commonwealth Bank) කුසලාන ක්‍රිකට් තරගාවලිය ලංකාවේ විකාශය කළ රූපවාහිනී නාලිකාව කවරේද;

(iii) එම නාලිකාව ඒ සඳහා තෝරා ගැනීමේ පදනම කවරේද;

(iv) ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ විකාශය කිරීමට සියලුම රූපවාහිනී නාලිකාවලට අවසර ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2777/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012.01.01 දින වන විට ගොවි විශ්‍රාම වැටුප් අරමුදලේ පැවති සම්පූර්ණ වත්කම් ප්‍රමාණය කොපමණද;

(ii) ගොවි විශ්‍රාම වැටුප ගණනය කිරීමේ ප්‍රතිපත්තිය මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

(iii) ගොවි විශ්‍රාම වැටුප නියමිත දිනට, නියමිත පරිදි ගෙවීමට අපොහොසත් වී ඇති තත්ත්වයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3164/'12

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මතුගම සාන්ත මේරි මාවත ලෙසින් පෙරදී හැඳින්වූ වත්මන් කුමාර වෙල්ගම මාවතේ, 1991 දී තාවකාලිකව ඉදිකර පසුව 2005.03.30 දිනැති ප්‍රාදේශීය සභා අනුමතිය අනුව ස්ථිරව තනා විදුලි සැපයුම ද ලබාගෙන තිබූ කඩ කාමර 70 ක් හදිසියේම කඩා ඉවත් කර ඇති බවත්;

(ii) එම නිසා පවුල් 70ක සාමාජිකයින් මේ වන විට අසරණව ඇති බවත්;

(iii) නව කඩ කාමර ලබාදීම සඳහා ප්‍රාදේශීය සභාව විසින් එක් කඩ හිමියෙකුගෙන් රු. 100000.00ක් බැගින් අත්තිකාරම් මුදල් ලබාගෙන ඇති බවත්;

(iv) නව කඩකාමර ඉදිකිරීමට ප්‍රාදේශීය සභාව සතු ඉඩමක පස් පරීක්ෂා කර ඇති නමුත් මෙතෙක් ඒවා ඉදිකර වෙළෙඳුන්ට ලබා නොදීම නිසා ඔවුන් විරෝධතා ක්‍රියාමාර්ගයන්ට යොමු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කඩකාමර කඩා ඉවත්කිරීමට උපදෙස් දුන් අය කවුරුන්ද;

(ii) නව කඩකාමර ලබාදීමට අයකළ අත්තිකාරම් මුදල් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) නව කඩකාමර ඉදිනොකිරීමට හේතුව කවරේද;

(iv) කඩ කාමර අහිමිවූ වෙළෙඳුන්ට නව කඩකාමර ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2450/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර සිට කතරගම දක්වා අධිවේගී මාර්ගයක් තැනීම සඳහා මේ වන විට සැලසුම්කර තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iii) එම අරමුදල් සපයාගනු ලබන්නේ දේශීය අරමුදල්වලින්ද; නැතහොත්, විදේශීය අරමුදල්වලින්ද;

(iv) දේශීය හා විදේශීය වශයෙන් සපයාගනු ලබන අරමුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම අරමුදල් සපයනු ලබන ආයතන හෝ රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අධිවේගී මාර්ගය ඉදිකිරීම නිසා නිල්වලා ගඟ පහළ නිම්නයේ පිහිටි ගම්මාන විශාල සංඛ්‍යාවක් ගංවතුරට ලක්වීම සිදු විය හැකි බව දන්නේද;

(ii) එම තත්ත්වයන් වළක්වා ගැනීම සඳහා සැලසුම්කර තිබේද;

(iii) මාර්ගය ඉදිකිරීම නිසා අහිමිවිය හැකි ඉඩම්, භෝග වගාවන් ඇතුළු අනෙකුත් දේපළ සඳහා වන්දි ගෙවීමේ සැලසුමක් තිබේද;

(iv) ඒ සඳහා අනුගමනය කරන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2513/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා තිබෙන මොනරවැව ගම්මානය, නැවත පදිංචි කරවීමේ වැඩපිළිවෙළ යටතේ බිහිවූ ගම්මානයක් බව පිළිගන්නෙහිද?

(ආ) (i) එම ගම්මානයේ නැවත පදිංචි කරවන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානයේ නැවත පදිංචි කළ ජනතාවට රජයේ අනුග්‍රහයෙන් ලබා දෙන සහන කවරේද;

(iii) එක පවුලක් සඳහා එම සහන ලබාදීම වෙනුවෙන් රජය වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2714/'12

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වන විට මෙරට තිබෙන ජාතික රෝහල් සංඛ්‍යාව සහ පෞද්ගලික රෝහල් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) එම රෝහල්වල,

(i) රෝගීන් සඳහා ඇති මුළු ඇඳන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඇඳන් සංඛ්‍යාව සහ වෛද්‍යවරු සංඛ්‍යාව අතර අනුපාතය කොපමණද;

(iii) එම ඇඳන් සංඛ්‍යාව සහ හෙද-හෙදියන් සංඛ්‍යාව අතර අනුපාතය කොපමණද;

(iv) රෝගීන් සංඛ්‍යාවට, හෙද-හෙදියන් සංඛ්‍යාවට, වෛද්‍යවරුන් සංඛ්‍යාවේ අනුපාතය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2773/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මිරිදිය හා කරදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයින් සංඛ්‍යාව;

(ii) 2010 මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ "සෑම ධීවර කාර්මිකයෙකු සඳහාම ආම්පන්න කට්ටලයක් ලබා දෙන්නෙමි" යනුවෙන් වූ පොරොන්දුවට අනුව මේ වනවිට ආම්පන්න ලබා දී ඇති ධීවරයින් සංඛ්‍යාව ;

(iii) එකී ආම්පන්න කට්ටල ලබා නොදුන් ධීවරයින් සංඛ්‍යාව;

(iv) උක්ත කරුණ සඳහා පොරොන්දු වූ වර්ෂයේ සිට මේ දක්වා වාර්ෂිකව වෙන් කරන ලද මුදල;

(v) එක් ආම්පන්න කට්ටලයක් සඳහා වැයවන මුදල;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ආම්පන්න කට්ටලයට අයත් ධීවර ආම්පන්න කවරේද;

(ii) එම කට්ටල නොමිලයේ ලබා දී තිබේද;

(iii) නොඑසේ නම්, එය ලබා දුන් ක්‍රමවේදය කවරේද;

(iv) මෙතෙක් ඉහත සඳහන් ධීවර ආම්පන්න ලබා නොදුන් ධීවරයින්ට එම උපකරණ ලබාදෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2452/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොනරාගල දිස්ත්‍රික්කයේ මඩුල්ල ප්‍රාදේශීය සභාවට අයත් ජීප් රථයක් සහ කැබ් රථයක් වර්ෂ ගණනාවක සිට ප්‍රාදේශීය සභා භූමියේ දිරාපත් වෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ප්‍රාදේශීය සභාව තුළ ඉහත සඳහන් දේපළ විනාශයට පත්වීමට ඉඩහැරීම සම්පත් නාස්තියක් බව පිළිගන්නේද;

(ii) මෙම රථවාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගැනීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම වාහන දෙක මඩුල්ල ප්‍රදේශීය සභාව විසින් භාවිතයට නොගන්නේ නම්, ඒවා වෙන්දේසි කර ආදායමක් ලබාගැනීමට කටයුතු නොකරන්නේ මන්ද;

(ii) එලෙස කටයුතු කිරීමට යම් බාධක තිබේනම්, ඒවා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2559/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006, 2007, 2008, 2009, සහ 2010 යන එක් එක් වර්ෂයේදී අධ්‍යාපනය වෙනුවෙන් වැය කළ සමස්ත මුදල එම වර්ෂයන්හිදී දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ඉහත පරිදි වෙන් කළ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයන් ඒ සඳහා ප්‍රමාණවත්වී තිබේද;

(iii) අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින වත්මන් තත්ත්වය අනුව එහි දියුණුව උදෙසා දැනට වඩා වැඩි මුදලක් වෙන් කළ යුතු බව පිළිගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2715/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) මෙම කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලද්දේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වාර්තාවේ ඇති නිර්දේශවලින් ක්‍රියාත්මක කර තිබෙන නිර්දේශ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිර්දේශ ක්‍රියාත්මක කළ දිනයන් කවරේද;

(iii) එම වාර්තාවේ නිර්දේශ අතරින් ක්‍රියාත්මක නොකරන නිර්දේශ කවරේද;

(iv) රජය විසින්ම ඉහත සඳහන් කොමිසම පත් කරන ලද නමුත් එම කොමිසමේ නිර්දේශ රජය විසින් නොපිළිගැනීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2775/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජන සෙවන නිවාස දසලක්ෂයේ ජනාවාස හා නිවාස වැඩසටහන යටතේ 2600වන ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් "සසුනට සවිය" නමින් නිවාස ව්‍යාපෘතියක් ක්‍රියාත්මකකර තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ව්‍යාපෘතියේ මූල්‍ය කටයුතු පාලනය සඳහා මුදල් භාරකාර මණ්ඩලයක් හෝ වෙනත් කමිටුවක් පත්කර තිබේ නම් එහි සාමාජිකයින්ගේ නම් සහ තනතුරු;

(ii) එම ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපයා ගන්නා ආකාරය;

(iii) එම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ කරගැනීමට මේ වනවිට හඳුනාගෙන ඇති විහාරස්ථාන;

(iv) උක්ත වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මකකර ඇති විහාරස්ථාන;

(v) එම විහාරස්ථාන වෙනුවෙන් කර ඇති ගෙවීම් හෝ සංවර්ධන කටයුතු;

(vi) මෙම ව්‍යාපෘතිය නිමකිරීමට ඉලක්කගත වර්ෂයක් තිබුණේ නම්, එම වර්ෂය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.175/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ පාසල් සිසුන්ගේ දැනුම පුළුල් කිරීම,— ශ්‍රී ලංකාවේ අනාගත තරුණ තරුණියන්ගේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලෙස සහ මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන්නාවූ වර්ධනයට සාපේක්ෂව පුහුණු ශ්‍රමිකයින්ගේ අවශ්‍යතාව සපුරා ගැනීමේ අරමුණ ඇතිව පාසල් විෂය නිර්දේශයට මෝටර් කාර්මික ශිල්පය විෂයයක් ලෙස ඇතුළත් කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.176/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ සහ විදේශ රටවල මෝටර් කාර්මික ක්ෂේත්‍රයේ ඇතිවන වර්ධනයට සරිලන ලෙස, එම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින්ගේ ඉල්ලුම සපුරාලීමට හැකිවන පරිදි, පාසල් මට්ටමින් ඉගැන්වීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීමට මෝටර් කාර්මික ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යාපන විද්‍යා පීඨයක් ඇති කළ යුතුයැයි  මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.177/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— මෝටර් කාර්මික ශිල්පය විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීම,— මෝටර් කාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ රජයේ කාර්මික විද්‍යාල හා අනුබද්ධ ආයතනවල ඉගෙනුම් කටයුතු සිදු කරනු ලබන්නේ වසර 25-30 ක් තරම් පැරණි විෂය නිර්දේශයක් යටතේ බැවින්, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා එම විෂය නිර්දේශයන් යාවත්කාලීන කිරීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.178/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ත්‍රිරෝද රථ හා යතුරු පැදි ආශ්‍රිත රැකියාවල නියුක්ත වූවන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය තහවුරු කිරීම,— ශ්‍රී ලංකාව තුළ ජීවත්වන ත්‍රිරෝද රථ හා යතුරුපැදි ආශ්‍රිතව ඍජු හා වක්‍ර ලෙස රැකියාවන්හි නියුක්තවීමට කැමැත්තක් දක්වන තරුණ පිරිස හා විශ්‍රාමික ත්‍රිවිධ හමුදා නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යන ජන කණ්ඩායම්වල ආර්ථික ශක්තිය වර්ධනය කිරීමෙන් සමස්ත ජාතික නිෂ්පාදිතයට ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමේ අරමුණ ඇතිව එම ක්ෂේත්‍රයේ නියුක්තවූවන්ගේ සක්‍රිය දායකත්වය ජාතික ආර්ථිකයට එක් කර ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් කඩිනමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.179/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකීය/දේශීය සූපවේදය පිළිබඳ රට තුළ ජනතා ආකල්ප පුළුල් කිරීම,— ශ්‍රී ලාංකීය/දේශීය ආහාර කලාව පිළිබඳ දේශීය හා විදේශීය ජනතාව තුළ වැඩි නැඹුරුවක් ඇති කිරීමේ අරමුණ ඇතිව, රට තුළ ජනතා ආකල්ප ඒ වෙත යොමු කිරීම සඳහා පාසල්, විශ්වවිද්‍යාල, තෘතීයික අධ්‍යාපන ආයතනවල විෂය පාඨමාලාවට සූපවේදය විෂයයක් ලෙස ඇතුළත් කිරීමටත්, රාජ්‍ය හා පෞද්ගලික අංශවල මැදිහත්වීම මත පර්යේෂණ අංශ දිරිගැන්වීම මගින් නව සොයාගැනීම් සිදු කිරීමටත්, ඒ හා බැඳුනු ආයතන පද්ධතිය සම්බන්ධ කර ගනිමින් සහතික පත්‍ර, ඩිප්ලෝමා, උපාධි, පශ්චාත් උපාධි පාඨමාලා ඇති කිරීම තුළින් මෙම ක්ෂේත්‍රය පිළිබඳ ජනතාව තුළ පුළුල් ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.180/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාවේ ආහාර සංස්කෘතිය ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලාංකීය ආහාර කලාව, රස කාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංශ ගණනාවකින් සකස්වී ඇති අතර ඒ හා බැඳුණු ශ්‍රී ලාංකීය ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මෙන්ම දේශීය හා විදේශීය ජනතාව අතර අපගේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීම මගින් ශ්‍රී ලාංකීය අනන්‍යතාව අන්තර්ජාතිකව ඔසවා තැබීම සඳහා වැඩපිළිවෙළක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

## 2013 මැයි මස 21 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2195/'11

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී, ලංකා පුත්‍ර සංවර්ධන බැංකුවට අදාළව,

(i) යොදවන ලද සමස්ත ප්‍රාග්ධනය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) කොටස් මත ලද ආදායම් සහ වත්කම් මත ලද ආදායම් ප්‍රමාණයන් කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයෙහි සමස්ත සේවක සංඛ්‍යාව සහ එක් සේවකයෙකු වෙනුවෙන් වැයවන මුළු මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) ඉහත තොරතුරු පෞද්ගලික අංශයේ බැංකු ආයතනයක් හා සන්සන්දනාත්මකව කොපමණද;

(v) පුනරාවර්තන නොවන වියදම් කොපමණද;

(vi) බදු සහ තීරු බදු ලෙස රජයට ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2220/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, “සැමට නිවසක් - හිතට සෙවණක්” වැඩපිළිවෙළ යටතේ, නාගරික මහල් නිවාස හා රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචිකරුවන් තම නිවසේ සින්නක්කර අයිතිකරුවන් බවට පත්කිරීමේ වැඩපිළිවෙළ මාස තුනක් ඇතුළත නිම කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැඩපිළිවෙළ ආරම්භ කළ දිනය හා අවසන් කළ දිනය කවරේද;

(ii) එම වැඩසටහන යටතේ තම නිවසේ සින්නක්කර අයිතිය ලැබූ නාගරික මහල් නිවාසී පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ වෙනත් නිවාස යෝජනා ක්‍රමවල පදිංචි ඉහත පරිදි සින්නක්කර නිවාස අයිතිය ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2273/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2011 වර්ෂය සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය පවත්වන ලද දිනය කවරේද;

(ii) එකී විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන ලද දිනය කවරේද;

(iii) නිකුත් කරන ලද ප්‍රතිඵල අවලංගු කර නැවත ප්‍රතිඵල නිකුත් කිරීමක් සිදු කළේද;

(iv) එසේ නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කිරීමේදී ඇතිවූ අවුල් සහගත තත්ත්වය පිළිබඳ වගකිවයුත්තෝ කවුරුන්ද;

(ii) ඔවුන් සම්බන්ධයෙන් ගැනීමට නියමිත හෝ ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ප්‍රතිඵල සංශෝධනය හේතුවෙන් බලාපොරොත්තු කඩවී අපහසුතාවයට පත්වූ පාර්ශ්වයන් සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

(iv) ඉදිරියේදී විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් අවුල් සහගත තත්ත්වයන් ඇති නොවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2344/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දූෂිත පාරිසරික තත්ත්වයන් හේතුවෙන් ජනතාව රෝගීවීම වළක්වා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය ඒකාබද්ධව කටයුතු කළ යුතු බවට වන "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාවේ සඳහන් යෝජනාව පරිදි ක්‍රියා කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිපත්ති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2471/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුරයේ පැවති "දැයට කිරුළ" ප්‍රදර්ශනයට සමගාමීව පිහිටුවන ලද කෘෂි ප්‍රවර්ධන ගොවිපළවල් සඳහා වැයකළ මුදල කොපමණද;

(ii) එකී ගොවිපළවලින් ලත් ප්‍රතිලාභ කවරේද;

(iii) "දැයට කිරුළ" ප්‍රදර්ශනය පැවැත්වීමට පෙර ඔයාමඩුව සත්ව ගොවිපළට අයත්ව සිටි එළදෙනුන් පන්සියදෙනා දැන් රඳවා සිටින ස්ථානය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "දැයට කිරුළ" ප්‍රදර්ශනයට සමගාමීව ස්ථාපනය ස්ථිර ජලසම්පාදන යෝජනා ක්‍රමය සඳහා වැයකළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) "දැයට කිරුළ" ප්‍රදර්ශනය අවසන් වීමෙන් පසු එම ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබූ පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඔයාමඩුව සිට මානිස්සාගමුව හරහා තන්තිරිමලේ දක්වා දුම්රිය ධාවනය සඳහා දැරීමට සිදුවූ වියදම කොපමණද;

(ii) "දැයට කිරුළ" ප්‍රදර්ශනය පැවති දින නවය තුළ, එම දුම්රියෙන් ඉපැයූ ආදායම සහ ලැබූ ප්‍රතිලාභ කවරේද;

(iii) එකී දුම්රිය ධාවනය කිරීම සඳහා කරන ලද ඉදිකිරීම් ගලවා ඉවත්කිරීම සඳහා දැරීමට සිදුවූ වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2788/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සීමාසහිත ලංකා නැව් සංස්ථාවට අයත් "ලංකා මුදිත" නෞකාව මේ වනවිට විකුණා හෝ බදු දී තිබේද;

(ii) විකුණා හෝ බදු දී තිබේ නම්, එසේ කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) "ලංකා මුදිත" නෞකාව භාවිතයෙන් ඉවත්කළ දිනය කවරේද;

(ii) එම දිනයෙන් පසුව එම නෞකාව ස්ථානගතකර තිබූ ස්ථාන කවරේද;

(iii) භාවිතයෙන් ඉවත් කිරීමෙන් පසු එම නෞකාව වෙනුවෙන් දිනකට වැයකරන ලද මුදල කොපමණද;

(iv) භාවිතයෙන් ඉවත් කරන ලද දින සිට එකී නෞකාව වෙනුවෙන් වැයකරන ලද සමස්ත මුදල කොපමණද;

(v) එම නෞකාව විකිණීම ප්‍රමාද කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 මැයි මස 22 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2260/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) 2012 අයවැය යෝජනා මගින් විශ්වවිද්‍යාල සිසුන් සඳහා දැනට ලබා දෙන මහපොළ ශිෂ්‍යත්ව මුදල වැඩි කිරීමට පියවර ගෙන තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2278/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යෝජිත කලුගඟ ව්‍යාපාරය ආරම්භ කිරීමට කටයුතු කරන්නේද;

(ii) එම යෝජනා ක්‍රමය ආරම්භ කිරීමට හේතු කවරේද;

(iii) එම වාරි ව්‍යාපාරයට යටවන මුළු භූමි ප්‍රමාණය කොපමණද;

(iv) එම භූමිය තුළ ඇති කෘෂිකාර්මික වැදගත්කමක් ඇති ඉඩම් ප්‍රමාණය සහ වගා කර ඇති කෘෂිකාර්මික වගාවන් කවරේද;

(v) එයට යට වන ගම්මාන කවරේද;

(vi) එම ව්‍යාපාරය නිසා අවතැන්වන පවුල් සංඛ්‍යාව සහ ජනගහනය කොපමණද;

(vii) ඒ යටතේ ඉවත් කිරීමට සිදුවන රජයේ ආයතන, පෞද්ගලික ආයතන, විහාරස්ථාන සහ අනෙකුත් වැදගත් ස්ථාන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලබාගත් පරිසර ශක්‍යතා වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(ii) එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අවතැන්වන ජනතාව සහ ඔවුන්ට අහිමිවන වත්කම් වෙනුවෙන් ගන්නා ක්‍රියාමාර්ග කවරේද;

(iii) ආර්ථිකමය වශයෙන් ඉතා ඉහළ අගයක් ඇති ඉඩම් අහිමිවන හෙයින් සහ විශාල ජනතාවක් අවතැන්වන හෙයින් මෙම යෝජනා ක්‍රමය නවතා දැමීමට හෝ හානි අවම ස්ථානයක් වෙත ගෙන යාමට හෝ කටයුතු යොදන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2320/'12

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එළවළු ප්‍රවාහනය කිරීම සඳහා 2012 ජනවාරි මස 15 වැනි දින සිට හඳුන්වා දෙන ලද කූඩ ක්‍රමය ක්‍රියාත්මක වෙමින් පවතින ආකාරය කවරේද;

(ii) කූඩ ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව, නරක් නොවී ඉතිරිකර ගනු ලබන එළවළු ප්‍රතිශතය සහ ඒවායේ වටිනාකම රුපියල්වලින් කොපමණද;

(iii) ඉහත සඳහන් ඉතිරිය විගණනය කරනු ලබන ක්‍රමය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කූඩ ක්‍රමය ක්‍රියාත්මක කිරීම නිසා එළවළුවල මිල පහත බැස තිබේද;

(ii) එසේ නම්, මිල ගණන් අඩු වී ඇති ප්‍රමාණයන් ඒ බව තහවුරු කළ හැකි සාක්ෂිද සහිතව කවරේද;

(iii) ගොවියන් වෙත නැවත කූඩ ප්‍රවාහනය කිරීම සඳහා වැයවන වියදම දැරීම සම්බන්ධයෙන් වගකීම භාර ගන්නා පුද්ගලයාගේ නම කවරේද;

(iv) ගොවියන් වෙත නැවත කූඩ ප්‍රවාහනය කිරීම සඳහා වර්ෂයකට වැයවන වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2514/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා තිබෙන ගජබාපුර ගම්මානය නැවත පදිංචි කරවීමේ වැඩපිළිවෙළ යටතේ බිහිවූ ගම්මානයක් බව එතුමා පිළිගන්නේද?

(ආ) (i) එම ගම්මානයේ නැවත පදිංචි කරවන ලද පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානයේ නැවත පදිංචි කළ ජනතාවට රජයේ අනුග්‍රහයෙන් ලබා දෙන සහන කවරේද;

(iii) එක පවුලක් සඳහා එම සහන ලබාදීම වෙනුවෙන් රජය වැය කළ මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2718/'12

ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009, 2010 සහ 2011 යන වර්ෂවල සහ 2012 වර්ෂයේ සිට අද දක්වා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සතු මුදල් සංචිත වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් වර්ෂයේ ආරම්භයේදී සැලසුම් කරන ලද පරිදි එකී අය-වැය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට නොහැකි වී තිබේද;

(iii) එසේ නම්, එම තත්වයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) ක්‍රිකට් තරඟවල විකාශන අයිතීන් අලෙවිකිරීම තුළින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් 2009, 2010, 2011 සහ 2012 වර්ෂවලදී ඉපැයූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2789/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2006 සිට මේ දක්වා සීමාසහිත ලංකා නැව් සංස්ථාවට,

(i) බඳවාගෙන ඇති උපදේශකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) උපදේශකයින් බඳවාගත් දිනයන් සහ ඉවත් කළ දිනයක් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) ඉහත සඳහන් එක් එක් උපදේශකයාගේ,

(i) අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්;

(ii) මාසිකව ගෙවනු ලබන වැටුප් සහ දීමනාවල අගයන්;

(iii) පෙර සේවා ස්ථාන;

(iv) සේවා කාලය තුළදී සංස්ථාවට සිදුවී ඇති සේවය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 මැයි මස 23 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2279/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පළාත් පාලන ආයතන මගින් පාලනය වන දිවයින පුරා පිහිටි පුස්තකාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම පුස්තකාලවල පුස්තකාල සහකාර තනතුරේ සේවය කරන සේවක සේවිකා සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට ලබා දෙන මාසික වැටුප හෝ දීමනාව කොපමණද;

(iv) පළපුරුද්ද හා සේවා කාලය අනුව රජයේ සේවකයින්ට හිමි උසස්වීම් ලැබීමේ අවස්ථාව සහ විශ්‍රාම වැටුප් හිමිකම පුස්තකාල සහකාර තනතුරට හිමිවී තිබේද;

(v) එම උසස්වීම් අවස්ථා නොතිබේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පළපුරුද්ද හා සේවා කාලය අනුව රාජ්‍ය සේවයේ බහුතරයකට හිමි උසස්වීම් ලැබීමේ අවස්ථාව පුස්තකාල සහායකයින්ට හිමි නොවීම බලවත් අසාධාරණයක් සහ මානව හිමිකම් කඩවීමක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට එම අයිතිවාසිකම ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2340/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති මාලාව මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ කාන්තා රෝග නිවාරණය පිළිබඳ වෙනම අංශයක් ආරම්භ කිරීමට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) මේ වනවිට එම අංශය විවෘතව පවතින්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2463/'12

ගරු රවී කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2010, 2011 සහ 2012 යන වර්ෂයන්හිදී, "උතුරු වසන්තය" සහ "නැගෙනහිර උදානය" වැඩසටහන්වලට අදාළව,

(i) දැරීමට සිදුවූ වියදම සහ ඒවායින් ලැබුණු ප්‍රතිලාභ කවරේද;

(ii) ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(iii) මුදල් ප්‍රවාහයන් මගින් සත්‍ය වශයෙන් වැයකළ මුදල් ප්‍රමාණය ලෙස තහවුරු වූ නිශ්චිත වියදම කොපමණද;

යන්න එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) "උතුරු වසන්තය" සහ "නැගෙනහිර උදානය" වෙනුවෙන් 2010, 2011 සහ 2012 වර්ෂයන් සඳහා ලැබුණු මුළු ආධාර මුදල් සහ ප්‍රදානයන් ප්‍රමාණය එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2515/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ, සම්පත්නුවර රෝහලේ භෞතික සහ මානව සම්පත් ඌනතාවයන් රැසක් පවතින බව පිළිගන්නේද;

(ii) එම රෝහලේ පවතින භෞතික සහ මානව සම්පත් ඌනතාවයන් සහ අඩුපාඩුකම් කවරේද;

(iii) එම අඩුපාඩුකම් සම්පූර්ණ කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2719/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශන කොමිසම මගින් විමර්ශනය කරන ලද සිද්ධි සංඛ්‍යාව කොපමණද;

(ii) විභාග කිරීමෙන් අනතුරුව අධිචෝදනා බාරදෙනු ලැබූ සිද්ධි සංඛ්‍යාව කොපමණද;

(iii) (අ) (ii) හි සඳහන් කොට ඇති එක් එක් සිද්ධිය සම්බන්ධයෙන් සඳහන් කොට ඇති වරද, නියම කළ දඬය සහ ලබාදුන් දඬුවම කවරේද; සහ

(iv) එම කොමිසම ලද එක් සිද්ධියක් පිළිබඳව කටයුතු කර අවසන් කිරීමට ගනු ලබන සාමාන්‍ය කාල සීමාව කොපමණද;

යන්න 2011 සහ 2012 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විජේදාස රාජපක්ෂ මහතාගේ සභාපතිත්වය යටතේ නිකුත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවට අනුව ඉහත සඳහන් කොමිසම මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත කරුණු කවරේද;

(ii) එම වාර්තාවේ නිර්දේශයන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) එකී පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වාර්තාවේ දක්වා ඇති නිර්දේශයන්ට අනුකූලව ක්‍රියාත්මක නොවීමටත් ඒ සම්බන්ධයෙන් වැඩිදුර ක්‍රියා නොකිරීමටත් හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2790/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා මහපොල නෞකාව සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ කටයුතු සඳහා භාවිතයට යොදාගන්නා ලද දිනය කවරේද;

(ii) එම නෞකාව වෙනත් ආයතනයක් වෙත බදු හෝ කුලී පදනම මත ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත සඳහන් නෞකාව බදු හෝ කුලී පදනම මත ලබා දී තිබේ නම්,

(i) ලබාදුන් ආයතනය;

(ii) එසේ කළ දිනය;

(iii) බදු හෝ කුලී පදනම මත ලබාගත් සමාගමේ නාවික පලපුරුද්ද;

(iv) එම සමාගමේ මූල්‍ය වත්කම්;

(v) මාසිකව ලැබෙන බදු හෝ කුලී මුදල;

(vi) මේ වන විට අදාළ සමාගමෙන් ලබාගෙන ඇති සමස්ත මුදල හා ලබා ගැනීමට ඇති හිඟ මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූනි මස 04 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1947/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ පිහිටි, කපුදූව පේෂකර්ම මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ එහි උපකරණ මේ වන විට විනාශවෙමින් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එහි ඇති සම්පත් යොදාගෙන නැවත එම පුහුණු මධ්‍යස්ථානය යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කරන්නේද;

(ii) නොඑසේ නම්, එම ස්ථානය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකට හෝ වෙනත් කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2280/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයේ පාසල් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය ඇති කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථාන ඇති කරන ලද වර්ෂය කවරේද;

(ii) දිවයින පුරා පිහිටුවා ඇති එම පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) ආරම්භක වර්ෂයේ සිට එකී මධ්‍යස්ථාන සඳහා පත්කර ඇති කළමනාකරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම කළමනාකරුවන් අධ්‍යාපනඥ සේවයට ඇතුළත්කර තිබේද;

(v) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ආරම්භක වර්ෂයේ සිට මේ දක්වා එම මධ්‍යස්ථාන මගින් ගුරුවරුන්ට වෘත්තීය පුහුණුව ලබාදීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) ආරම්භක වර්ෂයේ සිට මේ දක්වා එම මධ්‍යස්ථාන මගින් වෘත්තීය පුහුණුව ලබා දී ඇති ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2356/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 සිට 2011 දක්වා අමාත්‍යාංශය වෙත ලැබුණු "මාස දහයක වැටුප් අත්තිකාරම්" ණය ඉල්ලුම්පත් සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද,

(ii) එම ඉල්ලුම්පත් අතුරින් එක් එක් වර්ෂය සඳහා ගෙවන ලද වැටුප් අත්තිකාරම් ණය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හදිසි මුදල් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ඉල්ලා සිටින එම ණය මුදල් ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද;

(ii) වර්ෂ 2011 දක්වා ලැබී ඇති, දැනට ගෙවීම් සිදුකර නොමැති වැටුප් අත්තිකාරම් ණය ඉල්ලුම්පත්වලට අදාළ ගෙවීම් කිරීම අවසන් කරන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2464/'12

ගරු රවී කරුණානායක මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2009, 2010, 2011 සහ 2012 යන වර්ෂයන්හිදී,

(i) රජය විසින් අවධානය යොමු කරන ලද විභවතාවක් ඇති කර්මාන්ත (Thrust Industries) කවරේද;

(ii) වාර්ෂික පදනමින් එම ක්ෂේත්‍රයන් සඳහා කරන ලද ආයෝජනයන් කවරේද;

(iii) එම ක්ෂේත්‍රයන්හි වර්ෂයකට ජනනය කරන ලද අමතර රැකියා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කරන ලද කර්මාන්තවලට පෙර පිරිනමන ලද සහ දැනට පිරිනමනු ලබන බදු සහන සහ දිරි දීමනා යනාදිය කවරේද;

(ii) 2009, 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා ඉහත සඳහන් කර්මාන්ත මත පැනවූ බදුවලින් ලැබූ මුළු ආදායම වාර්ෂික පදනමින් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2442/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ ගංවතුර වැළැක්වීම ව්‍යාපෘතියක් වූ නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ දෙවැනි අදියර මේ වන විට ක්‍රියාත්මක මට්ටමේ පවතින්නේද;

(ii) නොඑසේ නම්, එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කර තිබේද;

(iii) ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල්වලා ගඟ යෝජනා ක්‍රමයේ දෙවැනි අදියර සඳහා අරමුදල් සපයාගනු ලබන්නේ දේශීය අරමුදල්වලින්ද; නැතහොත්, විදේශීය අරමුදල්වලින්ද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන සපයන ආයතන හෝ රටවල්වල නම් කවරේද;

(iii) එම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත ප්‍රතිලාභ හිමිවන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2560/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006, 2007, 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් වැය කළ මුදල එම එක් එක් වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂයන්හිදී සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් වෙන් කළ දළ දේශීය නිෂ්පාදනයේ ඉහත ප්‍රතිශතයන් එම ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ප්‍රමාණවත් නොවූ බවත්;

(ii) වත්මන් තත්ත්වය අනුව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දියුණුව වෙනුවෙන් දැනට වෙන් කර ඇති මුදලට වඩා වැඩි මුදලක් වෙන් කළ යුතු බවත්;

පිළිගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2684/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "දැයට කිරුළ" ප්‍රදර්ශනයෙහි සංකල්පය එතුමා පැහැදිලි කරන්නෙහිද?

(ආ) (i) මේ දක්වා පැවැත්වූ එක් එක් දැයට කිරුළ ප්‍රදර්ශනයෙන් ජනනය කරන ලද රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාවන් කවරේද;

(iii) ඒවා ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත රැකියාද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අනුරාධපුරයෙහි පැවති දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා සත්‍ය වශයෙන්ම මුදල් වැය කළ වැය ශීර්ෂය කවරේද;

(ii) අවසන් වරට පැවැත්වූ දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා කිසිදු ගෙවීමකින් තොරව ලබාගත් ඇතැම් වත්කම් සහ ශ්‍රමය, එනම් සන්නද්ධ හමුදාවන්හි පුද්ගලයන් හෝ ශ්‍රමය සහ ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයෙහි බස්රථ, වැනි දෑ සම්පූර්ණ පිරිවැය ගණනය කිරීමේදී පිරිවැය සංරචකයන්හි ඇතුළත් කොට තිබේද;

(iii) එසේ නොමැති නම්, ඉහත කී ප්‍රදර්ශනය සඳහා මුළු පිරිවැය ගනනය කළ ආකාරය කවරේද;

(iv) පැවැත්වීමට නියමිත මීලඟ දැයට කිරුළ ප්‍රදර්ශනයන් තුන සඳහා අපේක්ෂිත පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2791/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මගී නැව් සේවාව ආරම්භ කරන ලද දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මේ වනවිට එම මගී නැව් සේවාව,

(i) පවත්වාගෙන යන්නේද;

(ii) පවත්වාගෙන නොයන්නේ නම්, එය නවතා දමා ඇති කාල සීමාව කවරේද;

(iii) නවතා දමා නැවත ආරම්භකර පවත්වාගෙන යන්නේ නම්, එම කාලසීමාව කවරේද;

(iv) මේ වනවිට පවත්වාගෙන නොයන්නේ නම්, නැවත ආරම්භ කරන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත සඳහන් මගී නැව් සේවාව පවත්වා ගෙන යෑම වෙනුවෙන්,

(i) මිල දී ගෙන හෝ බදු/කුලී පදනම මත ලබාගෙන ඇති වත්කම් කවරේද;

(ii) බදු හෝ කුලී පදනම මත ගොඩනැගිලි ලබාගෙන තිබේ නම්, එම ගොඩනැගිලි ලබාගත් ආයතනය කවරේද;

(iii) ලබාගත් ගොඩනැගිලි සඳහා මාසිකව ගෙවනු ලබන මුදල කොපමණද;

(iv) එම ගොඩනැගිලි සඳහා අදාළ කුලිය එකවර ගෙවා තිබේද;

(v) ගොඩනැගිලි සඳහා එකවර කුලිය ගෙවන ලද කාල වකවානුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූනි මස 05 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1955/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගා/ප්‍රජාපතී ගෝතමී බාලිකා විද්‍යාලයට පෞද්ගලික හිමිකරුවකු විසින් වර්ෂ තුනකට පමණ පෙර පරිත්‍යාග කරන ලද අම්බලන්ගොඩ විලේගොඩ පිහිටි තෙමහල් නිවස මේ දක්වා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන දිරාපත්වෙමින් පවතින බවත්;

(ii) අබලන් තත්ත්වයේ පවතින ඉහත නිවස පාසලේ අධ්‍යාපනය ලබන සිසුවියන්ගේ ජීවිතවලට තර්ජනයක්ව ඇති බවත්;

(iii) එම ගොඩනැගිල්ල කඩා ඉවත් කර එම ස්ථානයේ රැස්වීම් ශාලාවක් ඉදිකර දෙන ලෙස විදුහල්පතිතුමිය විසින් අවස්ථා ගණනාවකදී අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) විදුහල්පතිතුමියගේ ඉහත ඉල්ලීම අනුව කටයුතු කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2206/'11

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) දැනට සිටින කැබිනට් අමාත්‍යවරු සංඛ්‍යාව සහ එම අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) ඉහත සඳහන් අමාත්‍යාංශවලට 2012 අයවැයෙන් වෙන් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත සඳහන් ප්‍රතිපාදන දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) එම අමාත්‍යාංශවල සේවය කරන සමස්ත පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(v) එක් අමාත්‍යාංශයක් වෙනුවෙන් මසකට දරන මුළු වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් අමාත්‍යාංශ අතරින් කිසියම් අමාත්‍යාංශ සංඛ්‍යාවක් අහෝසි කිරීම හෝ අඩු කිරීම සිදු කළ හැකිද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2368/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) "මහින්ද චින්තන - දිනවමු ශ්‍රී ලංකා" ප්‍රතිපත්ති මාලාව මගින් පාසල් දරුවන්ට දිවා ආහාරය සඳහා බත් වේලක් නොමිලයේ ලබා දෙන බවට පොරොන්දුවක් ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව පරිදි සෑම පාසල් දරුවෙකුටම දිවා ආහාරය හිමි වන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iii) මේ වන විට දිවා ආහාරය සඳහා බත් වේලක් ලබා දෙන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) දිවා ආහාර ලබා දීම සඳහා එම පාසල් තෝරා ගත් පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2373/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ වර්තමාන සභාපතිවරයා කවුරුන්ද;

(ii) ඔහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) ඔහුගේ වැටුප කොපමණද;

(iv) වෙනත් දීමනා ලබාගන්නේ නම්, එම දීමනා කවරේද;

(v) එම එක් එක් දීමනාවන්හි අගයන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ සිටින අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අධ්‍යක්ෂවරයාගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) ඔවුන්ට ලබා දෙන දීමනාවල අගයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගමේ උප සභාපතිවරයෙකු හෝ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු සිටින්නේද;

(ii) එසේ නම්, ඔහුගේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් කවරේද;

(iii) ඔහුට හිමි වැටුප්, වේතන හා වෙනත් දීමනාවන්හි අගයන් කවරේද;

යන්න එතුමා තවදුරටත් සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2455/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුලියාපිටිය ප්‍රාදේශීය සභාව මගින් ඉදිකරන ලද කටුපොත නගර මධ්‍යයේ පිහිටා ඇති විජයසිරි සමරසිංහ ගුණානුස්මරණ පුස්තකාලය ප්‍රතිසංස්කරණය නොකිරීම නිසා වර්ෂ හතරක පමණ කාලයක සිට වසා දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පුස්තකාලය අලුත්වැඩියා කර පාඨක ජනතාවගේ ප්‍රයෝජනය සඳහා විවෘත කිරීමට කටයුතු කරන්නේද;

(ii) පුස්තකාල ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මේ වන විට ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන්කර ඇති එම මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2561/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මගින් කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් දියත් කරන වැඩසටහන් කවරේද;

(ii) මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂවලදී වෙන් කරන ලද මුදල වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙන් කරන ලද ඉහත මුදල් ප්‍රමාණයන් සහ ක්‍රියාත්මක කරන වැඩසටහන් කාන්තා අභිවෘද්ධිය ඇති කිරීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් ලබා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2792/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වකුගඩු රෝගීන්ගේ හිමොග්ලොබින් පාලනය කිරීම සඳහා ලබාදෙන එරිත්‍රොපොයිටීන් නමැති එන්නත වකුගඩු රෝගීන් සඳහා ප්‍රතිකාර කරන සියලු රජයේ රෝහල් වෙත හිඟයකින් තොරව ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම එන්නත ප්‍රමාණවත්ව ලබා දී නොමැති රෝහල් කවරේද;

(iii) ඉහත රෝහල් වෙත අදාළ එන්නත් ප්‍රමාණවත්ව ලබා නොදීමට හේතු කවරේද;

(iv) එම එන්නතක වෙළඳපොළ වටිනාකම කොපමණද;

(v) රජයේ රෝහල් වෙත එම ඖෂධය ලබා දී නොමැති නම්, එම රෝගයෙන් පීඩා විඳින රෝගීන්ට ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වකුගඩු රෝගය සඳහා එරිත්‍රොපොයිටීන් නමැති එන්නතට අමතරව වෙනත් විකල්ප ඖෂධ තිබේද;

(ii) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2817/'12

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රුපියල් මිලියන 350ක වටිනාකමකින් යුත් බඩ ඉරිඟු තොගයක් ශ්‍රී ලංකාවෙන් අපනයනය කළ බව 2012 මැයි මස 23 වන දින ප්‍රකාශ කළේද;

(ii) 2012 මැයි මස සිට බඩ ඉරිඟු අපනයනය පිළිබඳ සංඛ්‍යා දත්ත මාසික පදනමින් කොපමණද;

(iii) 2011 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ මුළු බඩ ඉරිඟු නිෂ්පාදනය වාර්ෂික පදනමින් කොපමණද;

(iv) බඩ ඉරිඟු නිෂ්පාදනයේ නිෂ්පාදන පිරිවැය කොපමණද;

(v) ශ්‍රී ලංකාව තුළ බහුල වශයෙන් බඩ ඉරිඟු වගා කරනු ලබන ප්‍රදේශ මොනවාද;

(vi) ශ්‍රී ලංකාව විසින් බඩ ඉරිඟු අපනයනය කරනු ලබන රටවල් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජුනි මස 06 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1965/'11

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ගාල්ල දිස්ත්‍රික්කයේ, නාගොඩ ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි, මලාමුර ඇළ හරහා පාලමක් ඉදිකිරීම සඳහා මුල්ගල් තබා වර්ෂ කිහිපයක් ගතවී ඇතත්, මෙතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීමට හේතු කවරේද;

(ii) ප්‍රදේශයේ ජනතාවගේ ගමන් පහසුව සඳහා මෙම පාලම කඩිනමින් ඉදිකිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මලාමුර ඇළ හරහා පාලම ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(ii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) මුදල් වෙන්කර තිබේ නම්, එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2365/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතෙන් ස්ථාපනය කරන ලද ගොවි විශ්‍රාම වැටුප සඳහා ගොවීන්ට දායකත්වය ලබාදීම ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විටත් ඒ සඳහා ගොවීන් බඳවා ගැනීම සිදු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) විශ්‍රාම වැටුප් දායකත්වය ලබාගත් ගොවීන්ගෙන් අද වන විට අයකර ගෙන ඇති මුළු දායක මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) වයස අවුරුදු 60 ඉක්මවූ, මේ වනවිට විශ්‍රාම ගොස් ඇති ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් ගොවි විශ්‍රාමිකයෙකු සඳහා ගෙවන ලද අවම මාසික විශ්‍රාම වැටුප කොපමණද;

(iv) 2011 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ගෙවන ලද මුළු විශ්‍රාමික වැටුප් මුදල කොපමණද;

(v) ගොවි විශ්‍රාම වැටුප් ගෙවීම මාස්පතා සිදු කර නොමැති නම්, එය එසේ ක්‍රියාත්මක කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2386/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාල සීමාව තුළ මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා අතරින් විමර්ශන කටයුතු සිදුකර ඇති ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iii) විමර්ශනය කිරීමට ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(iv) විමර්ශනය කිරීමට ඇති පැමිණිලි එම වර්ෂය තුළදීම විමර්ශනය නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත කාල සීමාව තුළ මානව හිමිකම් කඩ කිරීම සම්බන්ධයෙන් පැමිණිලි ලැබී ඇති ආයතන කවරේද;

(ii) එම එක් එක් ආයතනය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අනුව වැඩිම චෝදනා සංඛ්‍යාවක් එල්ල වී ඇති ආයතනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2819/'12

ගරු රවී කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව වෙත ගුවන් ගමන් සේවා සපයන ගුවන් සේවා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් සේවාවන්හි නම් කවරේද;

(iii) ඒවා ස්ථිර ගුවන් සේවාවන්ද; නොඑසේ නම්, කුලී පදනමින් වන ගුවන් යානා සේවාවන්ද;

(iv) එම ගුවන් සේවාවන්ට හයවැනි පියාසර නිදහස (sixth freedom of traffic) එනම් වෙනත් රටවල් දෙකක් අතර සේවා සැපයීම අතරතුරදී තම රටේද නතර වී යළි පියාසර කිරීමේ අයිතිය පවතීද;

(v) මෙම සියලුම ගුවන් සේවාවන් මගින් මසකට ප්‍රවාහනය කළ හැකි මුළු මගීන් සංඛ්‍යාව කොපමණද;

(vi) පසුගිය වර්ෂයේදී මෙරටට පැමිණි මුළු සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

(vii) සංචාරක පැමිණීම් සම්බන්ධ ඉලක්ක සපුරා ගැනීම සඳහා මෙම ගුවන් සේවාවන් උපකාරී වන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2456/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන මිද්දෙණිය මහජන පොළ පවත්වාගෙන යාම සඳහා නව ගොඩනැගිලි ඉදිකර වර්ෂ දෙකක් පමණ ගත වී ඇතත්, මේ දක්වා එය විවෘතකර නොමැති බවත්;

(ii) දැනට පෞද්ගලික ඉඩමක බදු පදනම මත එම පොළ පවත්වාගෙන යනු ලබන බවත්;

(iii) එම නිසා මහජන මුදල් නාස්තිවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මිද්දෙණිය මහජන පොළ නව ස්ථානයට ගෙනයාම සඳහා පවතින බාධා කවරේද;

(ii) එම බාධක ඉවත්කර මහජන පොළ පවත්වාගෙන යැමට ඉදිකළ නව ගොඩනැගිල්ල විවෘත කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2562/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ විවිධ පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයන් හට ලැබෙන මාසික වේතනයන් කොපමණද;

(ii) එම නියෝජිතයින්ට ප්‍රමාණවත් වේතනයන් ලැබෙන්නේද;

(iii) පළාත් පාලන ආයතනවල කටයුතු කරන මහජන නියෝජිතයින්ට ජනතා සේවාවන් ඉටු කිරීම සඳහා ලබා දෙන පහසුකම් හා දීමනා කවරේද;

(iv) ප්‍රශස්ථ ජනතා සේවාවක් ඉටු කිරීමට එම දීමනා හා පහසුකම් ප්‍රමාණවත්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2794/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපතිවරයාගේ මාසික වැටුප 2006 වර්ෂයේ සිට මේ දක්වා වෙනස් වී ඇති ආකාරය කවරේද;

(ii) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වත්මන් සභාපතිවරයා එම තනතුරට අමතරව දරන වෙනත් තනතුරු හෝ තනතුර කවරේද;

(iii) එම තනතුරු හෝ තනතුර දැරීම වෙනුවෙන් මාසිකව ඔහුට ලැබෙන වැටුප්, දීමනා හෝ වෙනත් පහසුකම් කවරේද;

(iv) එම තනතුර හෝ තනතුරු ලබාගත් දින සිට මේ දක්වා ඒවාට අදාළව මාසිකව ලැබෙන වැටුප්, දීමනා හෝ වෙනත් පහසුකම් වෙනස් වී ඇති අකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2823/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දුරකථන සංවාදවලට රහසිගතව සවන්දීම හෝ එම සංවාද රහසිගතව පටිගත කිරීම දැනට ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල කටයුත්තක්ද;

(ii) රහසිගතව දුරකථන සංවාද ශ්‍රවනය කිරීම සහ පටිගත කිරීම අතීතයේදී කරනු ලැබුවේද;

(iii) එසේ නම්, එසේ සිදුවූ කාලපරිච්ඡේදය කවරේද;

(iv) වගකීම් ඉටුකිරීමට බැඳී සිටීම විමර්ෂණයට ලක් කෙරෙන විදුලි සංදේශ සමාගම්වල නම් මොනවාද;

(v) පුද්ගලයකු සතු මූලික අයිතිවාසිකම්වලට බලපෑමක් ඇති කරන දුරකථන සංවාද රහසිගතව ශ්‍රවනය කිරීම හෝ පටිගත කිරීම සඳහා අවසරදීමට බලය ඇති බලධාරියා කවරෙක්ද?

(vi) සිය දුරකථන මාර්ග රහසිගතව ශ්‍රවනය කිරීමට හා පටිගත කිරීමට ලක් වූ දේශපාලඥයින්ගේ නම් කවරේද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 ජූනි මස 07 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2411/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2012.02.11 දින හෝ ඊට ආසන්න දිනක සිදුකළ ඉන්ධන මිල ඉහළ දැමීම හේතුවෙන් අපහසුතාවට පත්ව ඇති කුලී ත්‍රිරෝද රථ හිමියන්ට සහන සැලසීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග හෝ ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

(ii) එම ත්‍රිරෝද රථ හිමියන්ට ඉන්ධන සහනාධාරයක් ලබාදෙන්නේද;

(iii) එසේ නම්, එය ලබාදෙන ක්‍රමවේදය කවරේද;

(iv) මෙම සහනාධාරය ලබා දීම සිදුකරන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුලී ත්‍රිරෝද රථ හිමියන්ට ඉන්ධන සහනාධාරයක් ලබා නොදෙන්නේ නම්, එයට හේතු කවරේද;

(ii) රටට බරක් නොවී ස්වයං රැකියාවක යෙදෙමින් සමාජයට ද සේවාවක් ලබා දෙමින් කටයුතු කරන එම පිරිසට සහන ලබා නොදීම බලවත් අසාධාරණයක් නොවන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2457/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මීට වර්ෂ හතරකට පමණ පෙර මුල්ගල් තබා ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද මාතර දිස්ත්‍රික්කයේ, අතුරලිය ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වෙන්කරන ලද මුළු මුදල කොපමණද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන සපයන ලද ආයතනය කුමක්ද;

(iii) ප්‍රතිපාදන සපයා තිබේ නම්, ඉදිකිරීම් කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

(iv) එහි ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2563/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව මගින් කාන්තාවන්ගේ අභිවෘද්ධිය උදෙසා දියත් කරන වැඩසටහන් කවරේද;

(ii) එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂවලදී වෙන් කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වෙන් කළ ඉහත මුදල් වැයකර ක්‍රියාත්මක කරන වැඩසටහන් මඟින් කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ප්‍රමාණවත් සේවාවක් ඉටුවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2825/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ තුළ රාජ්‍ය අංශයේ උත්පාදනය වූ රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) 2007, 2008, 2009, 2010 සහ 2011 යන වර්ෂ තුළදී බිහිවූ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දැනට මෙරට සිටින රැකියා විරහිත උපාධිධාරීන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iv) රාජ්‍ය අංශයේ සේවයේ නියුතු උපාධිධාරියකු හට ගෙවනු ලබන සාමාන්‍ය මාසික වැටුප කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2458/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අකුරැස්ස දිස්ත්‍රික් රෝහලෙහි ජල නල පද්ධතිය සහ ජල ටැංකි ප්‍රමාණවත් නොවීමෙන් රෝගීන් ගැටලු රැසකට මුහුණපාන බවත්;

(ii) රෝහලෙහි රෝගීන් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවීමත් සමග එම ගැටලුකාරී තත්ත්වය වර්ධනය වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අකුරැස්ස රෝහලට ප්‍රමාණවත් ජල පහසුකම් ලබාදීමට සැලසුම් කර තිබේද;

(ii) ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) එම රෝහලේ ජල පහසුකම් පුළුල් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2564/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොට්ටාව, මත්තේගොඩ නිවාස යෝජනා ක්‍රමයේ පදිංචිකරුවන්ගේ යහපත උදෙසා වෙන් කර තිබූ ගහකොළ සහිත බිම් තීරුවේ අඩකට වැඩි කොටසක ඇති ගස් ඉවත් කර නව ඉදිකිරීමක් සඳහා කොන්ක්‍රීට් දමන ලද ආයතනය හෝ සමාගම කවරේද;

(ii) එම නිවාස සංකීර්ණයේ තිබූ පොදු නාන ළිඳ සහිත බිම් කඩ වටා තහඩු වැටක් ඉදිකොට පදිංචිකරුවන් විසින් එම ළිඳ භාවිතා කිරීම වළකනු ලැබූ අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම නිවාස සංකීර්ණයේ මාර්ග නිසි ලෙස නඩත්තු නොකර එම කාර්යයන් හෝමාගම ප්‍රාදේශීය සභාවට පැවරීමට හේතු කවරේද;

(ii) එහි පිහිටුවනු ලැබ ඇති භූගත ජල ටැංකිය නිසි ලෙස නඩත්තු නොකරන්නේ මන්ද;

(iii) නිවාස යෝජනා ක්‍රමයේ ආදායම් සියල්ල ලබා ගන්නා නිවාස සංවර්ධන අධිකාරිය පදිංචිකරුවන්ගේ සුබසාධනය සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගෙන එහි නව ඉදි කිරීම් ඇරඹීමට සූදානම් වන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2795/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව;

(ii) එම හරස් මාර්ග අතරින් මගීන් වැඩි ප්‍රමාණයක් දෛනිකව ගමන්ගන්නා මාර්ග ලෙස හඳුනාගෙන ඇති සංඛ්‍යාව;

(iii) එම හරස් මාර්ග සඳහා ස්ථාපිත කර ඇති දුම්රිය හරස් ගේට්ටු සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ගවලදී සිදු වූ අනතුරු සංඛ්‍යාව, මරණ සංඛ්‍යාව වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2006 වර්ෂයේ සිට මේ දක්වා එවැනි අනතුරුවලින් සිදුවූ දේපළ හානිවල වටිනාකම වාර්ෂිකව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් දුම්රිය හරස් ගේට්ටුවක් සවි කිරීම සඳහා වැයවන මුදල කොපමණද;

(iv) දුම්රිය හරස් ගේට්ටුවක සේවය කරන්නෙකු වෙත මාසිකව ගෙවනු ලබන වැටුප හෝ දීමනාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2826/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 වර්ෂයේ සිට මේ දක්වා වූ කාල සීමාව තුළ එක් එක් වර්ෂයේදී,

(i) යුද අධිකරණය හමුවට පමුණුවන ලද ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) යුද හමුදාවේ බ්‍රිගේඩියර් නිලයේ හෝ එම නිලය හා සම තත්ත්වයේ නිලයක සේවය කරන නාවික හමුදාවේ සහ ගුවන් හමුදාවේ නිලධාරීන් අතරින් යුද අධිකරණය හමුවට පමුණුවන ලද ආරක්ෂක නිලධාරීන්ගේ නම් එම එක් නිලධාරියාට එරෙහිව නැගූ චෝදනාද සමගින් ඉදිරිපත් කරන්නේද;

(iii) එම නිලධාරීන්ට ලබාදුන් දඬුවම්වල කාලසීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රටේ පවත්නා අධිකරණ පද්ධතියට යුද අධිකරණය අනුමත කිරීමට සිදුවී තිබේද;

(ii) එසේ නම්, යුද අධිකරණයන් විසින් ලබාදී ඇති දඬුවම් අවලංගු කිරීමේ හැකියාවක් තිබේද;

(iii) යුද අධිකරණ මගින් ලබා දුන් තීන්දු ඉවතලීමට බලය ඇති බලධරයා කවරෙක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූනි මස 18 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2415/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "ශ්‍රී ලංකා සංවර්ධන සේවය" යනුවෙන් රජයේ රැකියා ලබාදීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ යටතේ බඳවා ගන්නා අයදුම්කරුවන්ගේ අවම සුදුසුකම් කවරේද;

(iii) ඔවුන්ට ස්ථිර හා විශ්‍රාම වැටුප් හිමි තනතුරු ලබා දෙන්නේද;

(iv) එම බඳවා ගැනීම සිදු කරන ක්‍රියා පිළිවෙත කවරේද;

(v) බඳවාගනු ලබන අයට ලබාදෙන මූලික වැටුප සහ අනෙකුත් දීමනා කවරේද;

(vi) ඔවුන්ට පැවරී ඇති කාර්ය භාරයන් කවරේද;

(vii) ඒ යටතේ බඳවා ගනු ලබන සංඛ්‍යාව කොපමණද;

(viii) රාජ්‍ය අංශයේ පුරප්පාඩු ඉතා විශාල ප්‍රමාණයක් තිබිය දී එම පුරප්පාඩු සම්පූර්ණ නොකර මෙම සේවය සඳහා බඳවා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2521/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 1978 වර්ෂයේ සිට 2005 වර්ෂයේ ඔක්තෝබර් දක්වා පත්වූ විධායක ජනාධිපතිවරුන් විසින් ලබාදී ඇති ජනාධිපති සමාව යටතේ සිර දඬුවම්වලින් නිදහස ලබා ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එසේ නිදහස ලැබූවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2566/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) බෙන්තර ගඟේ වම් ඉවුර හා දකුණු ඉවුර ව්‍යාපාරවලට අයත් විශාල කුඹුරු ප්‍රමාණයක් පුරන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) "අපි වවමු - රට නගමු" වැඩසටහන යටතේ එම කුඹුරු නැවත වගා කිරීමට ගත් පියවර කවරේද;

(ii) එම නැවත වගාකිරීමේ වැඩසටහනින් පසු ඉහත සඳහන් කුඹුරුවල අස්වැන්න වැඩිවී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බෙන්තර ගඟ ඔස්සේ ගලා එන මුහුදු ජලය හේතුවෙන් ඉහත සඳහන් කුඹුරු විනාශවන බව දන්නේද;

(ii) මුහුදු ජලය කුඹුරුවලට ගලායාම වැලැක්වීමට කිසියම් පියවරක් ගනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2828/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල සීමාව තුළ එක් එක් වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ රැකියා කිරීමට අවසර ලබාදී ඇති චීන ජාතික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) චීන ජාතිකයන් සඳහා වන වීසා අවශ්‍යතාවල විශාල වැඩිවීමක් ඇතිවීමට හේතුව කවරේද;

(iii) අප රටේ මෙතරම් විශාල විරැකියා තත්ත්වයක් පවතිද්දී මෙතරම් විශාල සංඛ්‍යාවක් චීන ජාතික ශ්‍රමිකයන් පිරිසක් සිටීම සාධාරණීකරණය කළ හැකි ආකාරය කවරේද;

(iv) චීන ජාතික ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවකට මෙරට රැකියා කිරීමට අවසරදීම තුළින් මෙරටට අහිමිවන ධනය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2522/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උක් පර්යේෂණ ආයතනය සඳහා 2011 වර්ෂයේ අය - වැය ලේඛනය මගින් වෙන් කරන ලද මුදල කොපමණද;

(ii) වෙන් කරන ලද මුදලින් වියදම් කරන ලද සත්‍ය වියදම කොපමණද;

(iii) 2012 අය - වැය මගින් එම ආයතනය සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක් පර්යේෂණ ආයතනය විසින් භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතුවල මුදල් ආයෝජනය කර තිබේද;

(ii) එසේ නම්, එලෙස ආයෝජනයකර ඇති මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2568/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුරලිය - හැඩිගල්ල මාර්ගයෙන් ඇරඹෙන මැල්ලගහවිල සිට නෙළුව දක්වා දිවෙන මාර්ගය වර්ෂ ගණනාවක සිට අබලන්ව පවතින බවත්;

(ii) එම මාර්ගය පාසල්, දහම් පාසල්, රජයේ කාර්යාල හා කර්මාන්තශාලා වෙත ගමන් කිරීම සඳහා බෙහෙවින් භාවිත වන මාර්ගයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය වර්ෂ ගණනාවක සිට සංවර්ධනය නොකිරීමට හේතු කවරේද;

(ii) එම මාර්ගය සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2796/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, දොස්තරවත්ත නමැති ප්‍රදේශයේ සිදුකරනු ලබන වැලි ගොඩදැමීම ආරම්භකළ දිනය කවරේද;

(ii) ඒ සඳහා අදාළ ආයතනවලින් අවසර ලබාගෙන තිබේද;

(iii) එම වැලි ගොඩදැමීම සිදුකරගෙන යන අයගේ නම කවරේද;

(iv) ඒ සඳහා භාවිතා කරන යන්ත්‍රසූත්‍ර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් වැලි ගොඩදැමීමට අදාළ පරිසර ශක්‍යතා වාර්තාව සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයේ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(ii) එම ස්ථානයෙන් එක් දිනක දී ගොඩදැමීමට නිර්දේශිත වැලි කියුබ් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වැලි ගොඩදැමීමට ලබාදී ඇති බලපත්‍රයේ කාල සීමාව කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) දොස්තරවත්ත නමැති ස්ථානයේ සිදුකරනු ලබන වැලි ගොඩදැමීම හේතුවෙන් දැවැන්ත පරිසර විනාශයක් සිදු වන බව දන්නේද;

(ii) මේ වන විට එහි සිදු වී ඇති පාරිසරික විනාශය සම්බන්ධයෙන් ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2857/'12

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පවත්වාගෙන යනු ලබන මුළු රන් සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) රජය විසින් අලෙවි කරන ලද රත්‍රන් ප්‍රමාණය කොපමණද;

(iii) එය අලෙවි කරන ලද මිල කවරේද;

(iv) ඉහතකී රත්‍රන් මිලදී ගත් පාර්ශ්වය කවරේද;

යන්න 2012 වර්ෂය සඳහා එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජය විසින් පවත්වාගෙන යා යුතු මුළු රන් සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත කී රත්‍රන්වල වටිනාකම කොපමණද;

(iii) රජය විසින් එවන් රත්‍රන් ප්‍රමාණයක් රැස් කරගනු ලැබුවේ කෙසේද;

(iv) 2012 වර්ෂය තුළදී රන් සංචිත ප්‍රමාණය උච්චාවචනය වූයේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා රජය විසින් පවත්වාගෙන යනු ලබන විදේශ රන් සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ඉහත කී විදේශ රන් සංචිතවල වටිනාකම කොපමණද;

(iii) විදේශ රන් සංචිතවලින් අලෙවි කරන ලද ප්‍රමාණය කොපමණද;

(iv) රත්‍රන් අලෙවි කිරීම හෝ තබා ගැනීම පිළිබඳව තීරණය ගනු ලබන තැනැත්තා කවරෙක්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූනි මස 19 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2487/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වත්තල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, මුතුරාජවෙල තෙත්බිමට අයත් ඉඩම් කොටසක් විකිණීමට, බදු දීමට හෝ බෙදා දීමට කටයුතු යොදා තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) මුතුරාජවෙල තෙත්බිමට අයත් ඉඩම් සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කිරීම සඳහා අදාළ ආයතනයන්ගෙන් අවසර ලබාගෙන තිබේද;

(iv) එම අවසරය ලබා දුන් නිලධාරීන් කවුරුන්ද;

(v) ඉහත අවසර ලබා ගැනීමට අදාළ ලේඛන ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) හි පරිදි ඉඩම් ලබාදීමක් සිදුවී ඇත්නම්, එම ඉඩම් ලබාගත් අයගේ සම්පූර්ණ නම් සහ ලිපිනයන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මුතුරාජවෙල තෙත්බිමට අයත් ඉඩම් සම්බන්ධයෙන් ඉහත පරිදි කටයුතු කිරීම වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත උල්ලංඝනය කිරීමක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2570/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළමු වැනි පාර්ලිමේන්තුවේ සිට හත්වැනි පාර්ලිමේන්තුව දක්වා එක් එක් පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් කාන්තා නියෝජනය අදාළ පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රටේ වර්තමාන කාන්තා ජනගහණයේ ප්‍රතිශතය අනුව පාර්ලිමේන්තුව තුළ සාධාරණ නියෝජනයක් ලැබෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2700/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා සඳහා විදේශගතවූවන්ට ඔවුන් උපයනු ලබන ආදායමෙන් ඇමෙරිකන් ඩොලර් 20000ක මුදලක් ශ්‍රී ලංකාවේ බැංකුවක තැන්පත් කිරීමෙන් පසු තීරුබදු සහන යටතේ මෝටර් රථයක් මෙරටට ගෙන්වා ගැනීමේ පහසුකම ලබා දී තිබුණේද;

(ii) එම පහසුකම මේ වනවිට අත්හිටුවා තිබේද;

(iii) එසේ නම් , ඊට හේතු වූ කරුණු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i)හි සඳහන් පරිදි තීරු බදු සහන යටතේ වාහනයක් ලබා ගැනීමට තිබූ පහසුකම නැවත ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2859/'12

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 අංක 43 දරන පනත යටතේ රජයට පවරන ලද සෙලස්ටියල් ටවර්ස් (සෙලින්කෝ ඉන්වෙස්ට්මන්ට් සමාගම් සමූහය) සම්බන්ධයෙන් සිදු කර ඇති ප්‍රතිව්‍යුහගත කිරීම කවරේද;

(ii) ඉහත සඳහන් කළ දේපළ පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා කිසියම් ආයෝජකයෙකුට භාරදී තිබේද;

(iii) එසේ නම්, එම ආයෝජකයාගේ සහ අදාළ සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නව ආයෝජකයා වෙත භාරදී ඇති ඉහත සඳහන් දේපළ වෙනුවෙන් කර ඇති සමස්ත ආයෝජනය කවරේද;

(ii) ඉහත සඳහන් දේපළ සංවර්ධනය කිරීම වෙනුවෙන් අනෙකුත් ආයෝජකයින්ගෙන් ඉදිරිපත් වී තිබූ රුපියල් බිලියන 6.8ක් සහ රුපියල් බිලියන 8.5ක් වූ යෝජනා පිළිබඳව අදාළ බලධාරීන් දැන සිටියේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අද වන විට ඉහත සඳහන් කළ දේපළෙහි නිසි බලධාරීන් කවුරුන්ද;

(ii) රජය විසින් ඉහත සඳහන් නිසි බලධාරීන්ට මාසිකව ගෙවනු ලබන වේතනය කොපමණද;

(iii) ඉහත සඳහන් කළ නිසි බලධාරීන්ට ගෙවනු ලබන සමස්ත වේතනය සහ දීමනාවල වටිනාකම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2571/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළමුවැනි පාර්ලිමේන්තුවේ සිට හත්වැනි පාර්ලිමේන්තුව දක්වා එක් එක් පාර්ලිමේන්තුවේ සිටි කැබිනට් අමාත්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් අමාත්‍ය මණ්ඩලයන්හි සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එක් එක් අමාත්‍ය මණ්ඩලයන්හි සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව අදාල අමාත්‍ය මණ්ඩලයේ සිටි මුළු අමාත්‍යධූර සංඛ්‍යාවේ ප්‍රතිශතයක් වශයෙන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රටේ වර්තමාන කාන්තා ජනගහණයේ ප්‍රතිශතයට සරිලන සාධාරණ නියෝජනයක් අමාත්‍ය මණ්ඩල තුළ කාන්තාවන්ට ලැබී තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2701/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, අකුරැස්ස, තිබ්බොටුවාව, "සොමිකැලුම් හි පදිංචි බී. ජී. පී. අශෝක මහතා 2011.03.14 දින රාත්‍රී නැටුම් සංදර්ශණයක් නැරඹීම සඳහා තිබ්බොටුවාව කඩපිලට ගොස් සිටියදී මරණයට පත්ව ඇති බවත්;

(ii) පසුදින බලකාවල බෝක්කුවක් යට තිබී ඔහුගේ මළ සිරුර හමුවී ඇතත්, එම මරණය පිළිබඳව අකුරැස්ස පොලීසිය විසින් විධිමත් පරීක්ෂණයක් නොපැවැත්වූ බවට මරණකරුගේ බිරිඳ විසින් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අශෝක මහතාගේ මරණය සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණ කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2797/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ නිධන් හෑරීම සිදුකළ බවට වාර්තා වී ඇති ස්ථාන සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ස්ථාන අතරින් පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) නිධන් හෑරීමේ චෝදනාව මත මේ වනවිට අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iv) නිදන් හෑරීම්වලට සම්බන්ධව මේ වනවිට අත්අඩංගුවට ගෙන ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු කෞතුක භාණ්ඩ කවරේද;

(v) එම පුරාවිද්‍යාත්මක භාණ්ඩ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත අ(i) හි සඳහන් කාල සීමාව තුළ නිධන් හැරීම සඳහා කැණීම් සිදුකර ඇති, නමුත් ඊට අදාළව කිසිවෙකු අත්අඩංගුවට ගෙන නොමැති පුරාවිද්‍යා ස්ථාන ගණන කොපමණද;

(ii) එම ස්ථාන කවරේද;

(iii) වටිනාකම් සහිත පුරා වස්තූන් නිධන්ගත කර ඇතැයි සැලකෙන පුරාවිද්‍යාත්මක ස්ථාන ආරක්ෂා කිරීම සඳහා මේ වනවිට ක්‍රියාත්මකව ඇති වැඩපිළිවෙළ කවරේද;

(iv) ඒ සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2869/'12

ගරු රවි කරුණානායක මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලන්කන් ගුවන් සේවය විසින් කැතේ පැසිෆික් ගුවන් සේවයෙන් බදු පදනම මත ලබා ගත්;

(i) ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) ගුවන් යානාවල ආයු කාලය කොපමණද;

(iii) ගුවන්යානා ලබාගත් බදු කාල සීමාව සහ ගෙවන ලද මිල කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී ගනුදෙනුව පිළිබඳ සාකච්ඡා සඳහා ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ සභාපතිවරයා සම්බන්ධවූයේද;

(ii) මිලියන ගණනාවක් වටිනා එකී ගනුදෙනුව පිළිබඳව පුවත්පත්වල හෝ වෙබ් අඩවිවල දැන්වීම් පළ කරනු ලැබුවේද;

(iii) තරඟකාරී ලංසු ලැබුනේද;

(iv) මෙම ගනුදෙනුව කැතේ පැසිෆික් ගුවන්සේවයට පමණක් සීමා වූයේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අධික බදු කුලීවල ප්‍රතිඵලයක් ලෙස ඇතිවූ විශාල අලාභය හේතුවෙන් කැතේ පැසිෆික් ගුවන්සේවය සමග පැවති බදු ගිවිසුම අවලංගු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඉහත සඳහන් කළ කල් බදු ගනුදෙනුවේ දේශීය නියෝජිතයා සහ කැතේ පැසිෆික් සමාගමෙහි දේශීය නියෝජිතයාගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් කල කල්බදු නියෝජිත ශ්‍රී ලන්කන් ගුවන් සේවයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකුගේ පුත්‍රයෙකු වේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 ජූනි මස 20 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2575/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවි නැගුම වැඩ සටහන යටතේ ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති කවරේද;

(ii) එම වැඩසටහන් මගින් ආවරණය වන ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් ග්‍රාම නිලධාරී වසමකින් දිවි නැගුම ව්‍යාපෘතියට සම්බන්ධ කරගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම ව්‍යාපෘතියේ ප්‍රතිලාභී මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිවි නැගුම වැඩ සටහන සඳහා වෙන්කර ඇති මුළු මුදල මිලියනවලින් කොපමණද;

(ii) එම වැඩ සටහනේ ඉලක්කයන් කවරේද;

(iii) මේ වනවිට එම ඉලක්කයන්ගෙන් කොපමණ ප්‍රමාණයක් සපුරාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2703/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේවන විට ක්‍රියාත්මකව පවතින පිරිවෙන්වල සේවය කරනු ලබන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරුවරුන්ට රජයේ පාසල්වල සේවය කරනු ලබන ගුරුවරුන් සඳහා ලැබෙන නිදහස් දුම්රිය ප්‍රවේශපත්‍ර, අඩුපොලිය මත ලබා දෙන දේපළ ණය සහ ආපදා ණය ලබා නොදෙන බව දන්නේද;

(iii) එක සමාන සේවාවක් ඉටු කරනු ලබන ගුරුවරුන් සඳහා ඉහත පරිදි ආකාර දෙකකට සැලකීම යුක්ති සහගත නොවන බව පිළිගන්නේද;

(v) එසේ නම්, එම තත්ත්වය මඟහැරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2799/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ක්‍රිකට් තරග විකාශන අයිතිය ලබා දී ඇති රූපවාහිනී නාලිකාව කුමක්ද;

(ii) එම අයිතිය පවරාදුන් දිනය කවරේද;

(iii) පවරාදුන් විකාශන අයිතිය වලංගු වන කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය වෙත ක්‍රිකට් තරඟ විකාශන අයිතිය ලබා දීම පිළිගත් ක්‍රමවේදයන්ට අනුව මිල ගණන් කැඳවා සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා මිල ගණන් ඉදිරිපත් කළ ආයතන හා එක් එක් ආයතනය විසින් ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ක්‍රිකට් තරග විකාශන අයිතිය ලබාදීම සඳහා ඉහත ආයතනය විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලබා දී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2887/'12

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමන්, ගරු අමාත්‍යවරුන් සහ ප්‍රධාන නිලධාරීන් එක්සත් රාජධානියේ, ඉන්දියාවේ, ඕස්ට්‍රේලියාවේ සහ කැනඩාවේ සංචාරය කරන විට ඔවුන්ට එරෙහිව විරෝධතා රැසක් පවත්වා තිබේද;

(ii) එසේ නම්, එවැනි සිදුවීම් නැවැත්වීම සඳහා එම රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල හෝ මහකොමසාරිස් කාර්යාල භාවිතා කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය අපොහොසත් වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එවැනි අපහසුසහගත සිදුවීම් සම්බන්ධයෙන් එම රටවල් ශ්‍රී ලංකාවෙන් සමාව ඉල්ලා තිබේද;

(ii) එසේ නම්, එය සිදුකරන ලද්දේ කවදාද; කොහිදීද; සහ කවුරුන් විසින්ද;

(iii) හටගත හැකි ගැටලු සහගත තත්ත්වයන් පිළිබඳව, ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාල සහ තානාපති කාර්යාල විසින් සොයා බලා, එකී රටවල ඇතැම් ප්‍රදේශයන්හි නැගී එන විරෝධාකල්ප පිළිබඳව ශ්‍රී ලංකා රජය වෙත දැනුම් දී ඇත්ද යන වගත්, එසේ වුණි නම් ශ්‍රී ලංකා නියෝජිත මණ්ඩලය විසින් මුහුණ දුන් අපහසු සහගත සිදුවීම් වළකා එවැනි තත්ත්වයන් නිවැරදි කරගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලිය යුතු නොවේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2578/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ නැවත පදිංචි කරවීමේ වැඩසටහන යටතේ පදිංචි කළ මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) නැවත පදිංචි කරවීමේ වැඩසටහන යටතේ එක පවුලක් වෙනුවෙන් ලබාදෙන සහන කවරේද;

(iii) එක් පවුලක් සඳහා ලබාදෙන සහනවල වටිනාකම කොපමණද;

(iv) එම සහන එක් පවුලක් සඳහා ප්‍රමාණවත් වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2704/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයින පුරා පිහිටි පිරිවෙන් කටයුතු අධීක්ෂණය සඳහා පත්කර ඇති පිරිවෙන් පරීක්ෂක ස්වාමීන්වහන්සේලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පරීක්ෂක ස්වාමීන්වහන්සේලාගේ නම්, ලිපිනයන් හා අධ්‍යාපන සුදුසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම තනතුර දරන ස්වාමීන්වහන්සේලාගේ අකාර්යක්ෂමතාව සහ අඩු අධ්‍යාපනික සුදුසුකම් හේතුවෙන් පිරිවෙන් අධ්‍යාපනය අකාර්යක්ෂම වී ඇති බව පිළිගන්නේද;

(iv) එම තත්ත්වය මඟ හැරවීම සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් එම තනතුරුවලට පත්කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2800/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දැයට කිරුළ ප්‍රදර්ශනය පැවැති ඔයාමඩුව මාර්ගයේ කිලෝමීටර තුනක දුර ප්‍රමාණයක් කාපට් අතුරා අලුත්වැඩියා කිරීම සඳහා උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වැය කළ මුදල කොපමණද;

(ii) එම මාර්ගය අලුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් ක්‍රමවේදයන් අනුගමනය කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා අයදුම් කළ එක් එක් අයදුම්කරුගේ නම, ලිපිනය සහ ටෙන්ඩර් මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ටෙන්ඩරය ප්‍රදානය කළ සමාගමේ හිමිකරුගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය අලුත්වැඩියාව සඳහා ඉඩම් අත්පත් කරගෙන තිබේද;

(ii) එසේ නම්, අත්පත්කර ගත් මුළු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) අත්පත්කර ගත් ඉඩම්වල හිමිකරුවන්ගේ නම්, ලිපිනයන් සහ ලබා ගත් ඉඩම් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත මාර්ග අලුත්වැඩියාව යටතේ අලුතින් ඉදිකළ බෝක්කු සහ පාලම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ගය මෙයට පෙර අලුත්වැඩියා කරන ලද වර්ෂය සහ කුමන තත්ත්වයක් යටතේ අලුත්වැඩියා කළේද;

(iii) එම වර්ෂයේදී ඊට වැය වූ මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2888/'12

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අද වන විට විදේශ රටවල් විසින් ශ්‍රී ලංකාවේ පත්කොට ඇති කොන්සල්වරුන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොන්සල්වරුන්ගේ නම් සහ අදාළ රටවල් කවරේද;

(iii) ඔවුන් විසින් සිය රටවල් ශ්‍රී ලංකාවේදී නියෝජනය කරනු ලබන්නේ කවර දිනවල සිටද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙරට සුනාමි බලපෑමට හසුවූ අවස්ථාවේදී හැර එක් එක් කොන්සල්වරයාගේ ධූර කාලය තුළ ශ්‍රී ලංකාව වෙත ලැබුණු ප්‍රතිලාභ කිසිවක් ලැබුණේද;

(ii) ශ්‍රී ලංකාවේදී ඔවුන් සිදුකරගෙන යන කාර්යයන් පිළිබඳව ඔවුන් විසින් ශ්‍රී ලංකා රජය වෙත වාර්තා කොට තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 ජූනි මස 21 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2580/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට රැකියා විරහිත තරුණ පරපුර සඳහා ප්‍රාදේශීය මට්ටමින් කර්මාන්ත ශාලා ස්ථාපනය කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එවැනි කර්මාන්ත ශාලා පිහිටුවීමේ වැඩසටහනක් දියත් කිරීමට කටයුතු කරන දිනය කවරේද;

(iii) එම වැඩසටහනෙහි ඉලක්කයන් කවරේද;

(iv) එම ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරන්නේ කෙසේද:

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2706/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර, පඹුරණ, ශාරිපුත්‍ර මහා විද්‍යාලයේ අතිරික්ත ගුරුවරුන් පිළිබඳව මාතර කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් විසින් 2012 වර්ෂයේදී සිදුකළ විගණනය අනුව දීර්ඝ සේවා කාලයක් සහිත අතිරික්ත ගුරුවරුන්ගේ නාම ලේඛනයක් සකස් කර ඇති බවත්;

(ii) එම නාමලේඛනය අදාළ නිලධාරීන් විසින් විද්‍යාලයේ ලොග් සටහන් පොතේද සටහන් කර ඇති බවත්;

(iii) එම විද්‍යාලයේ වර්තමාන විදුහල්පතිනියට හිතවත් ඉහත නාමලේඛනයෙහි නම් සඳහන් ගුරු පිරිස රඳවාගෙන, කාල සටහන් සහිත අඩු සේවා කාලයක් ඇති වෙනත් ගුරුවරුන් පිරිසක් සඳහා ස්ථාන මාරුවීම් ලබා දී ඇති බවත්;

(iv) විදුහල්පතිනියගේ අත්තනෝමතික ක්‍රියා කලාපය නිසා මාරුකරන ලද ගුරු පිරිසට දැඩි අසාධාරණයක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත විදුහලේ අතිරික්ත ගුරුවරුන් පිළිබඳ කලාප අධ්‍යාපන කාර්යාලය මගින් සිදුකළ විගණනයේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2802/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පඩුවස්නුවර නැගෙනහිර සහ බටහිර ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශවල සමෘද්ධි ප්‍රතිලාභී පවුල් ඉලක්ක කර ගනිමින් කොහු බඳුන් නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කළ දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අරමුණ කවරේද;

(iii) ඒ සඳහා වෙන්කළ මුදල කොපමණද;

(iv) ඒ යටතේ ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(v) ආරම්භකළ වර්ෂයේ සිට මේ දක්වා එම ව්‍යාපෘතිය යටතේ සිදුකළ වාර්ෂික නිෂ්පාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම නිෂ්පාදන මිලදී ගනු ලබන ආයතන කවරේද;

(vii) මේ වනවිට එම ව්‍යාපෘතිය ලබා ඇති ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2896/'12

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට "ප්‍රිවි කවුන්සිලයක්" (පෙරවි මඩුල්ලක්) ක්‍රියාත්මක වන්නේද;

(ii) එවන් "ප්‍රිවි කවුන්සිලයක්" කිසි කලෙක හෝ ක්‍රියාත්මකව තිබුනේද;

(iii) එසේ නම්, එය ක්‍රියාත්මක තිබූ කාල සීමාව කවරේද;

(iv) ප්‍රිවි කවුන්සිලය හෝ ඊට සමාන වූ ක්‍රමවේදයන් අහෝසි කොට දමා ඇති බැවින් අද වන විට අධිකරණ පද්ධතිය තුළ අභියාචනා ක්‍රියාවලියක් සඳහා පවත්නා යාන්ත්‍රණය කුමක්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිදහසින් පසු මේ දක්වා ක්‍රියාත්මක කොට ඇති අතීතයට බලපාන අන්දමින් ක්‍රියාත්මක කළ හැකි නීති මොනවාද;

(ii) ඒවා පනවනු ලැබූ හා ක්‍රියාත්මක කරනු ලැබූ දිනයන් වෙන් වෙන් වශයෙන් මොනවාද;

(iii) අතීතයට බලපාන අන්දමින් ක්‍රියාත්මක කළ හැකි නීති සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක නොකරන බවට පිළිගැනීමක් තිබේද;

(iv) නොඑසේ නම්, 2003 - 2004 වර්ෂවල බදු නිදහස් කිරීමේ නීතිය ක්‍රියාත්මක කරනු ලැබුවේ කෙසේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2581/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගම්මානවලට කවර කාල සීමාවක් තුළදී විදුලිය ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී උතුරු පළාතේ එකී සියලු ගම්මානවලට විදුලිය ලබා දීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2707/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයට පෙර රාජ්‍ය දැව සංස්ථාවේ සහකාර ප්‍රාදේශීය කළමනාකාර තනතුර සඳහා, සේවයේ නියුතු වැඩ බිම් නිලධාරී සහ ගබඩා නිලධාරී තනතුරු දරන අය අතරින් තරග විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම්ලත් අය තෝරාගත් බවත්;

(ii) 2012 වර්ෂයේ සිට එම තරඟ විභාගය නොපවත්වා සම්මුඛ පරීක්ෂණයෙන් පමණක් ඉහත තනතුර සඳහා පත්කිරීම් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත අ(ii)හි සඳහන් පරිදි කරනු ලබන බඳවා ගැනීම් නවතා 2012 ට පෙර තිබූ ආකාරයට එම බඳවා ගැනීම් සිදුකිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

2803/'12

ගරු දයාසිරි ජයසේකර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ටින් මාළු සැකසීම සඳහා ගාල්ලේ ආරම්භකර ඇති කර්මාන්ත ශාලාවේ,

(i) ආරම්භක දිනය කවරේද;

(ii) හිමිකාරිත්වය දරන ආයතනය කුමක්ද;

(iii) අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය කොපමණද;

(iv) ඇසුරුම් කිරීම සඳහා යොදාගන්නා මත්ස්‍යය වර්ගය හෝ වර්ග කවරේද;

(v) දෛනික මත්ස්‍යය අවශ්‍යතාව කොපමණද;

(vi) නිෂ්පාදන කටයුතු සඳහා යොදාගන්න ඉහත මත්ස්‍ය වර්ගවල හෝ වර්ගයේ දේශීය දෛනික අස්වැන්න කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ටින්මාළු කර්මාන්ත ශාලාව සඳහා අවශ්‍ය කරන මත්ස්‍යයින් මේ වනවිට ආනයනය කරන්නේද;

(ii) නොඑසේ නම්, එසේ කිරීමට සැලසුම්කර තිබේද;

(iii) එම මත්ස්‍යයින් ආනයනය කරනු ලබන හෝ එසේ කිරීමට අපේක්ෂිත රටවල් කවරේද;

(iv) මාසිකව ආනයනය කරන හෝ ආනයනය කිරීමට බලාපොරොත්තුවන මත්ස්‍ය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2901/'12

ගරු රවී කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රෝගීන් හට නොමිලේ ඖෂධ ලබාදීමද සමගින් නිදහස් සෞඛ්‍ය සේවය සැපයීම ඉටු කිරීමට රජය අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, 2011 සහ 2012 වර්ෂ දෙක සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් වශයෙන් වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) 2011 සහ 2012 වර්ෂ සඳහා නොමිලේ ඖෂධ ලබාදීම සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 සහ 2012 වර්ෂවලදී රජයේ රෝහල්වල වැඩිම වාර ගණනක් වෛද්‍යවරුන් නිර්දේශ කරන ලද සහ භාවිතා වූ ඖෂධ වර්ග 25 කවරේද;

(ii) 2011 සහ 2012 වර්ෂවලදී එකී ඖෂධ සඳහා වැයකළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඖෂධ වර්ග ආනයනය කරනු ලබන්නේද; නැතහොත්, ශ්‍රී ලංකාවේ නිපදවනු ලබන්නේද;

(iv) රජයේ රෝහල්වල ප්‍රමාණවත් තරම් ඖෂධ නොමැති කමින්, බාහිර ඖෂධ අලෙවිසල්වලින් ඒවා මිලදී ගැනීමට සිදුවී ඇතැයි රෝගීන් පැමිණිලි කරන්නේ මන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?